රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

**2023 ජනවාරි මස මහා සභා රැස්වීම.**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ **2023.01.12** දින පෙ.ව **10.00** ට පමණ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පවත්වන්නට යෙදුනු ගරු මහා සභාවේ රැස්වීම් වාර්තාවයි.

පැමිණීම.

1. ගරු සභාපති - එච්.සමන් කුලසූරිය මහතා
2. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි - ටී.එම්. ෂිහාම් මහතා
3. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි - ආර්.පී. සිරිපාල රත්නායක මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩබ්.ඒ.එස්. ආනන්ද පෙරේරා මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩී.එන්.ඒ.ආර්.හතරසිංහ මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ටී.ආර්. උපාලි විජේරත්න මහතා
7. ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.ඒ.සී.ඒ. අධිකාරි මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩබ්.ඒ. චන්ද්‍රපාල වේරගොඩ මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එච්.පී. සුදත් ආනන්ද මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී.කේ.යූ. විපුලාවතී හාමිනේ මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ.සී පුෂ්ප කාන්ති මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - පී.විජය කුමාර් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඩබ්.ඒ.එල්.ඩී. වික්‍රමආරච්චි මහත්මිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ඩී.එන්. සුරංගනී මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩබ්.ජී.එන්.පී. ජයතිලක මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩී.ඒ.බී.කේ.කරුණාරත්න මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - පි.ඒ සරත් මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ටී.සී. සම්පත් දිසානායක මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.ඒ. නිශාන්ත ප්‍රදීප් කරුණාරත්න මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - කේ.ජී.එල්. නිශ්ශංක මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.වත්සලා මධුෂානි රන්වලගේ මහත්මිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ජේ.ඒ.එස්.පී. ජයසූරිය මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එන්.ආර්. මංජුල නවරත්න මහතා
24. .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ඒ.නාලනී සුමිත්‍රා හෙට්ටි ආරච්චි මහත්මිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - පී.රාමචන්ද්‍ර මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එම්.එන්.එෆ් සානාස් මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එච්.නයනජිත් පුෂ්ප කුමාර මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

නොපැමිණීම

1. ගරු උප සභාපති - කේ.පි. රත්නපාල පීරිස් මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩබ්.එච්.එම්.පී.ඩී.වෛද්‍යරත්න මහතා

ආගම සිහි කිරීම

පළමුව ආගම සිහි කිරීමෙන් පසුව මහා සභාවට පැමිණි සියළු දෙනාම ගරු සභාපතිතුමා සාදරයෙන් පිළිගන්නා බව පවසමින් මහා සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

රණවිරුවන් සිහි කිරීම

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විනාඩියක නිශ්ශබ්දතාවයක් ගත කරමින් රණවිරුවන් සිහි කරන ලදි.

අ.පසුගිය සභා වාරයන්හි සභා වාර්තාවන් සභා සම්මත කිරීම

2022.12.15 දිනැති විශේෂ රැස්වීම් වාර්තාව හා 2022.12.22 දිනැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත එවා ඇති බවත්, එය කියවූවා සේ සලකා ඒ සම්බන්ධව යම් සංශෝධනයන් වේ නම් ඉදිරිපත් කරන ලෙසත් දැනුවත් කරන ලදි.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා විසින් පහත සංශෝධනය දක්වන ලදි.

2022.12.15 දිනැති ගරු විශේෂ රැස්වීම් වාර්තාවේ 2 පිටුවේ ඉ - 1 දරන යෝජනාවේ සභා තීරණයේ " මූලාසනය සඳහා පත් කල ගරු මන්ත්‍රීතුමා " යන්න " ගරු සභාපතිතුමා " ලෙස සංශෝධනය වීම.

ඉහත සංශෝධනයට යටත්ව 2022.12.15 දිනැති විශේෂ රැස්වීම් වාර්තාවද , 2022.12.22 දිනැති මාසික මහා සභා රැස්වීම් වාර්තාවද සභා සම්මත කිරිමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදි.

ඉහත සංශෝධනයට යටත්ව 2022.12.15 දිනැති විශේෂ රැස්වීම් වාර්තාවද , 2022.12.22 දිනැති මාසික මහා සභා රැස්වීම් වාර්තාවද සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, 2022.12.15 දිනැති විශේෂ රැස්වීම් වාර්තාව සංශෝධන සහිතවද, 2022.12.22 දිනැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතවද සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ආ.<u>ගරු සභාපතිතුමාගේ නිවේදන වාරය</u>

- නැත -

ඇ.<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම් සභාවට ඉදිරිපත් කිරීම</u>

- නැත -

ඈ.<u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

- නැත -

ඉ.<u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතාගේ යෝජනා,</u>

<u>ඉ - 01</u>

2022 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව තැපැල් මුද්‍රා යන්ත්‍රය සඳහා ගෙවිය යුතු රු.3469.00ක් සහ 2023 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා මසකට රු.30000.00 බැගින් පෝස් මාස්ටර් ජනරාල් කෑගල්ල වෙත (ගිණුම් අංක 027100129027337 ට) බැර කිරීමට ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව තැපැල් මුද්‍රා යන්ත්‍රය සඳහා ගෙවිය යුතු රු.3469.00ක් සහ 2023 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා මසකට රු.30000.00 බැගින් පෝස් මාස්ටර් ජනරාල් කෑගල්ල වෙත (ගිණුම් අංක 027100129027337 ට) බැර කිරීමට කටයුතු කිරීම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 02</u>

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/1/5/2018/14 හා 2018.12.13 දිනැති චක්‍රලේඛය අනුව 2022 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ව්‍යාපාර ලේඛන ලිවීමට අදාල පහත දීමනාව එම්.ඒ.ඒ.එම් පෙරේරා, පළාත් රාජ්‍ය කළමණාකරණ සේවා නිලධාරිනිය හට ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ඒකක ප්‍රමාණය - 427

එක් ඒකකයක් සඳහා ගෙවන මුදල - රු.2.00

සම්පූර්ණ මුදල - රු.854.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.රාමචන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/1/5/2018/14 හා 2018.12.13 දිනැති චක්‍රලේඛය අනුව 2022 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ව්‍යාපාර ලේඛන ලිවීමට අදාල ඉහත දීමනාව එම්.ඒ.ඒ.එම් පෙරේරා, පළාත් රාජ්‍ය කළමණාකරණ සේවා නිලධාරිනිය හට ලබා දීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 03**

2023 වර්ෂයට අදාළ වර්පනම් K පෝරම බෙදාදීම සඳහා සකසන ලද K පෝරම3533 ක් පරීක්ෂා කිරීමට අදාළව චක්‍රලේඛ C/LG/LG/1/3/2018/148 හා 2018.12.13 දිනැති චක්‍රලේඛයට අනුව රු.7066.00 ක් ගෙවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ඒකක ගණන - 3533 x 2

රු. 7066.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.විජේකුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයට අදාළ වර්පනම් K පෝරම බෙදාදීම සඳහා සකසන ලද K පෝරම 3533 ක් පරීක්ෂා කිරීමට අදාළව චක්‍රලේඛ C/LG/LG/1/3/2018/148 හා 2018.12.13 දිනැති චක්‍රලේඛයට අනුව රු.7066.00 ක් ගෙවීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 04**

කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ හා ගරු මහජන නියෝජිතයින්ගේ අවශ්‍යතා අනුව සකස් කරන ලද 2023 වර්ෂයට අදාළ පුහුණු සැලැස්ම 2022.12.22 දිනැති මහා සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, එය නැවත ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක 03)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එන්.ඒ.ආර් හතරසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ හා ගරු මහජන නියෝජිතයින්ගේ අවශ්‍යතා අනුව සකස් කරන ලද 2023 වර්ෂයට අදාළ පුහුණු සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 05**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර ගණනාවක සිට විවිධ හේතූන් මත බදුවලින් නිදහස් කරන ලෙස ඉල්ලුම් කරන ලද දේපල 40 ක හිඟ කපාහැරීමට කරනු ලැබූ ඉල්ලීමට අනුව අදාළ දේපළ පිළිබඳව ස්ථානීය පරීක්ෂණ සිදුකල පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව එකී දේපළ භෞතිකව හඳුනාගත නොහැකි දේපල බවත් අනෙක් දේපළ විවිධ හේතූන් මත ඉවත් කරන ලද දේපළ බවත් වාර්තා වේ. එනිසා එම දේපළ තව දුරටත් ලේඛනවල බිල්කරමින් ඉදිරියට ගෙනයාම සුදුසු නොවන බැවින් 2023 පළමු කාර්තුවේ සිට බිල් කිරීම නැවතීම සඳහා 2022.12.22 දිනැති මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, නැවත එය ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.(ඇමුණුම් අංක 04)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර ගණනාවක සිට විවිධ හේතූන් මත බදුවලින් නිදහස් කරන ලෙස ඉල්ලුම් කරන ලද දේපල 40 ක හිග කපාහැරීමට කරනු ලැබූ ඉල්ලීමට අනුව අදාළ දේපළ පිළිබඳව ස්ථානිය පරීක්ෂණ සිදුකල පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එකී දේපල දේපළ භෞතිකව හඳුනාගත නොහැකි දේපල බවත් අනෙක් දේපළ විවිධ හේතූන් මත ඉවත් කරන ලද දේපළ බවත් වාර්තා වන බැවින් , මෙම දේපල 40 ට අදාලව තව දුරටත් ලේඛන වල බිල්කරමින් ඉදිරියට ගෙන යාම සුදුසු නොවන බැවින්, 2023 පළමු කාර්තුවේ සිට මෙම දේපල 40 ට අදාලව බිල් කිරීම නැවතීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 06

2023 වර්ෂයට අදාළව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමේ කාල සටහන ගරු මහ සභාවේ අනුමැතියට සංශෝධිත යෝජනාව ඉදිරිපත් කරමි.

| අනු අංකය | කාර්තුව | කමිටු දිනය | කමිටු වේලාව | කමිටුව පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|---|
| 01 | පලවන කාර්තුව | 2023.03.24 | පෙ.ව 9.30 | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය |
| 02 | දෙවන කාර්තුව | 2023.06.23 | පෙ.ව 9.30 | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය |
| 03 | තුන්වන කාර්තුව | 2023.09.22 | පෙ.ව 9.30 | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය |
| 04 | හතරවන කාර්තුව | 2023.12.22 | පෙ.ව 9.30 | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එන්.ජ්.ආර් හතරසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයට අදාළව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමේ කාල සටහන අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 07

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම 2022.12.22 දිනැති මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, නැවත එය ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක 05)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 08

රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය ක්‍රීඩා නොවන වෙනත් සැණකෙලි හා සංගීත ප්‍රසංග ආදිය සඳහා ලබා දීමේදී ක්‍රීඩාංගනයට හානි සිදුවිය හැකි බැවින් එම හානිය ප්‍රතිපූර්ණය කර ගැනීමට ගිවිසුමක් සකස් කර ගැනීමට ගිවිසුමක් සකස් කරන ලෙස 2022.10.20 දිනැති ඉ-2 සහා යෝජනාව යටතේ තීරණය කර ඇත. ඒ අනුව ක්‍රීඩා උත්සව නොවන වෙනත් සියලු උත්සව වැඩසටහන් (සැණකෙලි, සංගීත ප්‍රසංග, වෙළඳ ප්‍රදර්ශන, ආගමික හා සංස්කෘතික වැඩසටහන්, විශේෂ වැඩසටහන්, රැස්වීම්) සඳහා ක්‍රීඩාංගනය කුලී පදනම මත ඉල්ලුම් කරන අවස්ථාවක රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව හා ගැණුම්කරු අතර අත්සන් කලයුතු ගිවිසුමේ කෙටුම්පත අනුමත කර ගැනීමට හා ඊට අදාලව පහත ගාස්තු අය කිරීමට හා අදාල ඇප තැන්පතුව තබා ගැනීමට 2022.12.22 දින සහා යෝජනා අංක ඉ-29 යටතේ ගරු මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, එය ඉදිරි සභාවට කල් තබන ලදි. සකස් කර ඇති ක්‍රීඩාංගන අතුරු ව්‍යවස්ථාව හා ඉදිරිපත් කරන ලද ගිවිසුම එකිනෙකට ගැලපෙන බැවින් ගිවිසුම් කෙටුම්පත අනුමත කර ගැනීමට හා ඊට අදාලව පහත පරිදි ගාස්තු අය කිරීමට හා අදාල ඇප තැන්පතුව තබා ගැනීමට ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ගිවිසුම 2022.12.22 න්‍යාය පත්‍රය සමඟ එවා ඇත )

- ❖ දිවා කාලයේ (පෙ.ව. 7.00 - ප.ව. 5.00 දක්වා) රු.25000.00
- ❖ රාත්‍රී කාලයේ (ප.ව. 6.00 සිට පසුදා අළුයම 2.00 දක්වා) රු.30000.00
- ❖ දිවා රාත්‍රී දෙකම (පෙ.ව. 7.00 සිට පසුදා අළුයම 2.00 දක්වා) රු.50000.00
- ❖ ඇප තැන්පතුව - ක්‍රීඩාපිටිය කුලියට ගැනීම සඳහා ගෙවන මුදල මෙන් 5 ගුණයක් ඇප තැන්පතුව ලෙස තිබිය යුතුය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා</u>

රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය සම්බන්ධ මේ යෝජනාව සංශෝධනය වෙලා ඇවිල්ලා තියෙනවා. සභාපතිවරයාට නෛතික බලයක් තියෙන්න ඕනි රාජ්‍ය ආයතන සම්බන්ධ වන උත්සව සඳහා කටයුතු කරන්න. රජයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවුරුදු උත්සවයක් කරන්න කියලා නිල වශයෙන් නිවේදනය කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , ප්‍රාදේශීය සභාව, පොලිසිය , අනෙකුත් පෞද්ගලික ආයතනත් සම්බන්ධ කරගෙන තමයි මේ අවුරුදු උත්සවය කරන්නේ. ඒ අවුරුදු උත්සවය කරනකොට සංගීතයකුත් ගොඩක් වෙලාවට පවත්වනවා. මේ ක්‍රියාමාර්ගය අපි අනුමත කරනකොට , එවැනි අවස්ථාවක කටයුතු කරන්න සභාපතිවරයාට බලය පැවරෙන්න ඕනි. නැත්නම් ඒකට කවුරුවත් ගෙවීම් කරන්නේ නෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවීම් කරන්නෙත් නෑ. ප්‍රාදේශීය සභාවෙන් ගෙවීම් කරන්නත් බෑ. එවැනි අවස්ථාවකට පමණක් මේකේ ඉඩ තියෙන්න ඕනි. පසුගිය කොරෝනා වසංගතය නිසා නැති වුනාට, හැම ගමනකම සිංහල අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අවුරුදු උත්සවයක් රුවන්වැල්ල නගරයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , ප්‍රාදේශීය සභාව එකතු කරගෙන කෙරුනා. ඉදිරියටත් කෙරෙනවා. එවැනි අවස්ථාවකදී මෙන්න මේ ගැටළුවට මුහුණ දෙන්න පුළුවන් විදියට සභාවට හෝ සභාපතිවරයාට තීරණයක් ගන්න ඒ අවස්ථාව ඉතුරු කර ගන්න පුළුවන් නම් හොඳයි. මේ යෝජනාව **ground** එක ආරක්ෂා කරන්න හොඳයි. අර කාරණයෙදි පමණක් පොඩ්ඩක් හිතන්න වෙනවා. රජයේ ආයතන කිව්වාට, රජයේ ආයතන පෞද්ගලිකව කරන ඒවා නෙවෙයි. පොදුවේ රාජ්‍ය අනුග්‍රහයෙන් කරන උත්සව. උදාහරණයක් හැටියට සිංහල , හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් කරන අවුරුදු උත්සවය. රාජ්‍ය අනුග්‍රහය යටතේ මොකක් හරි උත්සවයක් කලොත් , කවුරුත් ඒකට මුදල් දෙන්නෙ නෑ. සභාවට තමා ඒ මුදල බඳින්න වෙන්නේ. මොකද සභාවට මුදල් බඳින්න බැනේ. අනුමැතියකුත් නැනේ. ඒකට මොකක් හරි සාකච්චා කරලා , ඒ ඉඩ ප්‍රස්ථාව තියාගෙන , ඒයෝජනාව සභා සම්මත කරමු කියලා මම ඉල්ලනවා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

සංශෝධනය කරමු එහෙනම්.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා</u>

සංශෝධනයක් ගේන්න පුළුවන්. ඒක සාකච්චා කලා නම් හරි නේද? ඒකේ බලය සභාවටද? සභාපතිවරයාටද? එවැනි අවස්ථාවකදි තීන්දු, තීරණ ගන්නේ කවුද කියලා. සංශෝධනය කරනකොට, ඒ වකවානුවක් වෙනකොට සභාවක් පැවතුනේ නැත්නම් , සභාපතිවරයෙක් නැත්නම්, කොමසාරිස්තුමාට ඒ බලය තියෙන්න ඕනි. සභාවක් තියෙනවා නම් සභාපතිවරයාට ඒ බලය තියෙන්න ඕනි. සභාව නැත්නම් කොමසාරිස්ට බලය යනවානේ. සභාපතිවරයාට බලය පවරනවාද? මොකක් හරි සාකච්චා කරලා සංශෝධනයක් ගේන්න කියලා මම ඉල්ලනවා. සභාපතිවරයාට බලය පැවරීම සුදුසුයි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

සංශෝධන සහතිව සම්මත කරමු.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා</u>

ඉ - 8 යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා. රජය මගින් ලබා දෙන උත්සවයක් , උදාහණයක් හැටියට අවුරුදු උත්සවයක් වැනි අවස්ථාවකදී , මේ රාමුවෙන් පිට තීරණයක් ගැනීමට ඒ බලය සභාපතිවරයාට පැවරෙන ලෙස සංශෝධනය කරමින් මේ යෝජනාව සභා සම්මත කරමු. රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන මොකක් හරි උත්සවයක් කරනකොට. අපි කියමු, කෘෂි කර්ම වැඩ සටහනක් රජය විසින් කරනවා හිතමු. කෘෂි කර්ම

දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , ප්‍රාදේශීය සභාව සම්බන්ධ කරගෙන කරනවා. අවශ්‍ය කරන බීජ හරි දෙනවා. එවැනි අවස්ථාවකදි රජය විසින් කරන , පුද්ගලයෝ නෙවෙයි. එක ආයතනයක් ඇවිත් , තමන්ගේ පුද්ගලික වැඩක් කරන්න ඉල්ලුවට දෙන්න බෑ. ඒක පැහැදිලි වෙන්න ඕනි. රජය මගින් නිවේදනය කරන අවස්ථාවකදි. ඒකට අපි ඉඩ තියන්න ඕනි. ඉඩ නොතිබ්බොත් ප්‍රශ්නයක් වෙනවා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ගරු උපාලි මන්ත්‍රීතුමා, ඒ යෝජනාවට සංශෝධනයක් එකතු කලා. ඒ සංශෝධන පිලිබඳ කාගේ හරි විරෝධතාවයක් තියෙනවද?

රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය ක්‍රීඩා නොවන වෙනත් සැණකෙළි හා සංගීත ප්‍රසංග ආදිය සඳහා ලබා දීමේදී ක්‍රීඩාංගනයට හානි සිදුවිය හැකි බැවින්, එම හානිය ප්‍රතිපූරණය කර ගැනීමට සකස් කර ඇති ගිවිසුමත් , ඊට අදාලව ඉහත දැක්වෙන ගාස්තු හා ඇප තැන්පත් අය කිරීමත් , රජය මගින් ලබා දෙන උත්සවයක් , වැඩ සටහනක් (රජය මගින් නිවේදනය කරනු ලබන ) (රාජ්‍ය ආයතන කීපයක් සම්බන්ධ කර ගනිමින් ) ( එක් ආයතනයක් / එක් පුද්ගලයෙක් නොවේ. ) අවස්ථාවකදී මෙම රාමුවෙන් පිට තීරණයක් ගැනීමට සභාපතිවරයාට බලය පැවරීමත් යන ප්‍රකාශය සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය ක්‍රීඩා නොවන වෙනත් සැණකෙළි හා සංගීත ප්‍රසංග ආදිය සඳහා ලබා දීමේදී ක්‍රීඩාංගනයට හානි සිදුවිය හැකි බැවින්, එම හානිය ප්‍රතිපූරණය කර ගැනීමට සකස් කර ඇති ගිවිසුමත් , ඊට අදාලව ඉහත දැක්වෙන ගාස්තු හා ඇප තැන්පත් අය කිරීමත් , රජය මගින් ලබා දෙන උත්සවයක් , වැඩ සටහනක් (රජය මගින් නිවේදනය කරනු ලබන ) (රාජ්‍ය ආයතන කීපයක් සම්බන්ධ කර ගනිමින් ) ( එක් ආයතනයක් / එක් පුද්ගලයෙක් නොවේ. ) අවස්ථාවකදී මෙම රාමුවෙන් පිට තීරණයක් ගැනීමට සභාපතිවරයාට බලය පැවරීමත් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඉ - 09</u>**

**2022** වර්ෂයේ දෙසැම්බර් මසට අදාලව ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද ( ලක්ෂ **05** ට අඩු ) , රු. **19,365,909.47** ක වියදම් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක **06**)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, **2022** වර්ෂයේ දෙසැම්බර් මසට අදාලව ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද ( ලක්ෂ **05** ට අඩු ) , රු. **19,365,909.47** ක වියදම් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඉ - 10</u>**

**2023** වර්ෂයට අදාළ එක් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම **2022.12.22** දිනැති මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, නැවත එය ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක **07**)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.විජේකුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, **2023** වර්ෂයට අදාළ එක් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඉ - 11</u>**

**2023** වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම **2022.12.22** දිනැති මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, නැවත එය ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක **08**)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රාමචන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, **2023** වර්ෂය

සඳහා ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 12

2023 වර්ෂයට අදාළ මාර්ග අංශයේ ක්‍රියාකාරී සැලැස්ම 2022.12.22 දිනැති මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, නැවත එය ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක 09)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී. රාමචන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයට අදාළ මාර්ග අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 13

2023 වර්ෂයට අදාළ පරිසර හා සෞඛ්‍ය අංශයේ ක්‍රියාකාරී සැලැස්ම 2022.12.22 දිනැති මහ සභාවට ඉදිරිපත් කරනු ලදුව, ඉදිරි මහා සභාවට කල් තබන ලද අතර, නැවත එය ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක 10 )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.නයනජිත් පුෂ්ප කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයට අදාළ පරිසර හා සෞඛ්‍ය අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 14

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දෛනිකව ඒකරාශී කරනු ලබන නොදිරන කසල බැහැර කිරීමට ස්ථානයක් නොමැති බැවින්, දෛනිකව ඒකරාශී කරනු ලබන නොදිරන කසල වැලිකඩ, යටන්වල පදංචි ඩබ්. නිරාන් සජීව මහතාගේ "රුවන්වැල්ල දූවේ වත්ත " නැමති ඉඩමට බැහැර කිරීම වෙනුවෙන් මාසිකව රු.25,000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉහත නම සඳහන් ඉඩම් හිමිකරු විසින් ඉල්ලීමක් සිදු කර ඇත. ඒ අනුව 2023 ජනවාරි මස සිට ඉදිරි කාලය සඳහා නොදිරන කසල බැහැර කරනු ලබන ඉඩමට මාසිකව රු.25,000.00 ක මුදලක් ගෙවීම සුදුසුද , නැද්ද යන්න සහ එම ගෙවීම කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

2023 ජනවාරි මස සිට ඉදිරි කාලය සඳහා නොදිරන කසල බැහැර කරනු ලබන ඉඩමට මාසිකව රු.25,000.00 ක මුදලක් ගෙවීම සුදුසුයි කියල මම හිතනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දෛනිකව ඒකරාශී කරනු ලබන නොදිරන කසල බැහැර කිරීමට ස්ථානයක් නොමැති බැවින්, දෛනිකව ඒකරාශී කරනු ලබන නොදිරන කසල වැලිකඩ, යටන්වල පදංචි ඩබ්. නිරාන් සජීව මහතාගේ "රුවන්වැල්ල දූවේ වත්ත " නැමති ඉඩමට බැහැර කිරීම වෙනුවෙන් මාසිකව රු.25,000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඔහු විසින් ඉල්ලීමක් කර ඇති බැවින්, 2023 ජනවාරි මස සිට ඉදිරි කාලය සඳහා නොදිරන කසල බැහැර කරනු ලබන ඉඩමට මාසිකව රු.25,000.00 ක මුදලක් ගෙවීමට කටයුතු කිරීම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 15

ප්‍රාදේශිය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ 2021 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වන " අම්තිරිගල පුස්තකාල බහු කාර්ය ගොඩනැඟිල්ල ඉදි කිරීමේ පලමු අදියර , රුවන්වැල්ල මධ්‍යම පුස්තකාලය අළුත් වැඩියා කිරීම හා කියවීම් ශාලාව පුළුල් කිරීම , ඉඹුලාන පුස්තකාල ගොඩනැඟිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම " යන කර්මාන්ත සඳහා වූ ගිවිසුම්ගත කාලය අවසන් වී ඇති බැවින්, කොන්ත්‍රාත්කරු හා ආයතනය යන දෙපාර්ශවයේ කැමැත්ත මත මෙම ව්‍යාපෘති සඳහා වන ගිවිසුම් අවලංගු කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී කේ.ඩී.එන් සුරංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ 2021 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වන " අම්තිරිගල පුස්තකාල බහු කාර්ය ගොඩනැඟිල්ල ඉදි කිරීමේ පලමු අදියර , රුවන්වැල්ල මධ්‍යම පුස්තකාලය අළුත් වැඩියා කිරීම හා කියවීම් ශාලාව පුළුල් කිරීම , ඉඹුලාන පුස්තකාල ගොඩනැඟිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම " යන කර්මාන්ත සඳහා වූ ගිවිසුම්ගත කාලය අවසන් වී ඇති බැවින්, කොන්ත්‍රාත්කරු හා ආයතනය යන දෙපාර්ශවයේ කැමැත්ත මත මෙම ව්‍යාපෘති සඳහා වන ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 16**

2022.12.22 දින පැවති මහා සභාවේ උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනාවට අනුව, එම ස්ථානයේ ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ඉඩ කඩ නොමැති අතර, එම්.ආර්.එම් නස්ලම් මහතාට අයත් පොදු වෙළඳපල සංකීර්ණයේ 8 – B දරන කඩ කාමරයේ ඉල්ලීම් කර ඇති සැලසුමට අනුව ඒ සඳහා රු.1,050,000.00 ක මුදලක් වැය වන බව ඇස්තමේන්තු කර ඇත. එය සභාවට දැරිය නොහැකි වැය බරක් බැවින්, නස්ලම් මහතාටම සභාව විසින් ඉදිරිපත් කරන ලද සැලසුමට අනුව ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට අවසර ලබා දීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම 17 )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.විජේකුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2022.12.22 දින පැවති මහා සභාවේ උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනාවට අනුව, එම ස්ථානයේ ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ඉඩ කඩ නොමැති අතර, එම්.ආර්.එම් නස්ලම් මහතාට අයත් පොදු වෙළඳපල සංකීර්ණයේ 8 – B දරන කඩ කාමරයේ ඉල්ලීම් කර ඇති සැලසුමට අනුව ඒ සඳහා රු.1,050,000.00 ක මුදලක් වැය වන බව ඇස්තමේන්තු කර ඇත. එය සභාවට දැරිය නොහැකි වැය බරක් බැවින්, නස්ලම් මහතාටම සභාව විසින් ඉදිරිපත් කරන ලද සැලසුමට අනුව ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට අවසර ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 17**

2023 වර්ෂයට සම්මත වූ අයවැයට අනුව ගෝණගල්දෙණිය පොල භූමියේ ඉදි කිරීමට යෝජිත ගොඩනැඟිල්ලේ පළමු අදියර ලෙස කඩ කාමර 02 ක් ඉදි කිරීම සඳහා වන රු.7,800,000.00 ක ඇස්තමේන්තුව ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඩී.එන්.ජේ.ආර් හතරසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයට සම්මත වූ අයවැයට අනුව ගෝණගල්දෙණිය පොල භූමියේ ඉදි කිරීමට යෝජිත ගොඩනැඟිල්ලේ පළමු අදියර ලෙස කඩ කාමර 02 ක් ඉදි කිරීම සඳහා වන රු.7,800,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 18**

**GIS** සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා **generation I 5 , RAM = 2 TB , ROM 16 GB** වන **lap top** පරිගණකයක්, මිල ගණන් කැඳවා සුදුසු ආයතනයක් මගින් මිලදී ගැනීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, **GIS** සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා **generation I 5 , ROM = 2 TB , RAM 16 GB** වන **lap top** පරිගණකයක්, මිල ගණන් කැඳවා සුදුසු ආයතනයක් මගින් මිලදී ගැනීම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා:-</u>

<u>**01**</u>

<u>ඉ - **19**</u>

**2013** වර්ෂයේ ඉදි කරන ලද කඩ කාමර **17** හි අංක **03** කඩ කාමරයට අදාලව කීමනී වශයෙන් ලබා ගෙන ඇති රු.**200,000.00** ක මුදලක් පොරොන්දු වූ පරිදි කඩ කාමර ලබා දීමට නොහැකි වීම මත ආපසු ගෙවන ලෙස ඉල්ලා නීතිඥ අයි.ඩී රංජිත් විජේසිංහ මයා විසින් රුවන්වැල්ල දිසා අධිකරණයේ ගොනු කර ඇති අංක **1332** M නඩුව සම්බන්ධවයි. **2022.08.18** දින ගරු මහා සභාව මගින් අදාල මුදල ආපසු ගෙවීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමක්, අවශ්‍ය බවට තීරණය කර ඇති අතර, ඒ අනුව **2022.10.25** වෙනි දින පලාත් පාලන කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාරතුමා අමතා මෙම ඉල්ලීම ඉදිරිපත් කරන ලදි. ඒ අනුව **2023.01.03** වෙනි දින පලාත් පාලන කොමසාරිස් විසින් **1987** අංක **15** දරන ප්‍රාදේශිය සභා පනතේ **132** වන වගන්තියේ සභා අරමුදල් වියදම් දැරීමේදි එකී වියදම් දරන කාරණයන් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බවට සඳහන්ව ඇතත් , මෙම ඉල්ලීමට අදාල කාරණය එවැනි ප්‍රතිපාදනයක් තුලට ඇතුලත් නොවන බවත්, එබැවින් මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට අවශ්‍ය නිර්දේශ ලබා දීමක් සිදු කල නොහැකි බව වාර්තා කර ඇත. එබැවින්, අදාල මුදල ගෙවීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු මහා සභාවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

මම ස්ථිර කරනවා ඒ මුදල ගෙවිය යුතුයි කියලා. ඒ මුදල විතරක් නෙවෙයි , ඇත්තටම අපි තීරණය කරන්න ඕනි යම් පුද්ගලයෙක් තැන්පතු මුදලක් තිබ්බා නම් , ඒ කාර්යය ඉෂ්ට කරන්න බැරි වුනා නම්, ඒ මුදල් අපි ගෙවන්න ඕනි. සමහර අය පොළියත් එක්ක ඒ මුදල් ඉල්ලන්න ඉඩ තියෙනවා. සභාවේ ඒ මුදල් ඒ අය තැන්පත් කරලා තියෙන්නේ කඩ කාමර ලබා ගන්නනේ. ඒ කාරණය වුනේ නැත්නම් , ඒ අයට ඒ මුදල් ලබා ගැනීමේ අයිතිය තියෙනවානේ. ඉස්සරත් මට මතකයි මෙතන ඉන්න අපේ බර්ටි ගුණසේකර මහත්තයා එහෙම මුදල් ඉල්ලලා ලිපි ඉදිරිපත් කරලා තිබුනා. ශාන්ත ගුණසේකර නීතිඥ මහත්තයා ඉල්ලලා තිබුනා. ඒ මුදල් නිදහස් කරන් නැතුව අපි නැවතත් ඒ මිනිස්සු නඩු යන කල් ඉන්නවාද? අපිත් නඩු ගිහිල්ලා තව මුදල් ගන්නවද? ඒ නිසා මේක පූර්වාදර්ශයක් කරගෙන ඒ ඉල්ලන අයගේ මුදල් ගෙවීමට කටයුතු කරන්න කියලත් මං ඉල්ලනවා. ඒ මුදල් රඳවා තබා ගන්න අපිට අයිතියක් නෑ. ඊට පස්සේ අපි නඩු ගිහිල්ලා තව මුදල් වියදම් කරලා , අවුරුදු ගාණක් ගිහිල්ලා මේක ගෙවන්න තමයි වෙන්නේ. ඒ අය පොළිය දිගටම ඉල්ලා හිටියොත් , ඒකත් අපිට ගෙවන්න වෙනවා. ඒ මුදල තැන්පතුවක් විදියට තියාගෙන අපිත් පොළි ආදායමක් ලබලා තියෙනවානේ. අපි පොළි ආදායමක් ගත්තේ අනුන්ගේ තැන්පත් මුදලකට. ඒ මිනිස්සු තැන්පත් කරපු මුදල්. ඒ නිසා ඒ ඉල්ලන අයගේ මුදල් ගෙවීම සඳහාත් මේක පූර්වාදර්ශයක් කර ගන්න කියන ඉල්ලීම මම කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් මමත් අදහසක් ප්‍රකාශ කරන්න ඕනි. මමත් ඒ මතේම ඉන්නවා. මේ මුදල් ගෙවන්න ඕනි. මේ මුදල් ගත්තු ආකාරය සම්බන්ධයෙන් ගැටළු තියෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධනය සම්බන්ධයෙන් ඉවත් වෙච්ච කඩ සම්බන්ධයෙන් සභාව මුදල් ගැනීමේ ගැටළුවක් අපිට

තියෙනවා. ඒ අයට කඩයක් දෙන්න බැරි වුනාට , ඒ අයගේ ඉල්ලීමට සභාව මුදල් ගත්තා. හැබැයි මෙතන ඉන්නවා රුවන්වැල්ල නගරයේ කිසිම ව්‍යාපාරයක් කරපු නැති, අඩු ගානේ තැඹිලි වල්ලක් තියාගෙනවත් පාරේ විකුණපු නැති අය මුදල් බැඳලා තියෙනවා කඩ ඉල්ලලා. ඒවා වුනේ කොහොමද ? ඒවා අපිට තියෙන ගැටළු. ඒ නිසා මේ මුදල් රඳවා ගැනීම ලොකු ගැටළුවක්. මේ කඩ හිමියෝ කඩ තිබිලා , මේ නිසා අහිමි වෙච්ච අයට අපි කඩ දිය යුතුයි. කොතනින් හරි කඩයක් දිය යුතුයි , ඒ අයගේ ජීවනෝපාය සකස් කර ගන්න. අපි ඒක කරේ නෑ. හැබැයි මට මතකයි , එදා ඔය ව්‍යාපෘතිය ආරම්භ වෙනකොට අපිත් ඒ සඳහා පෙනී සිටියා. මම නගරයේ ව්‍යාපාරික මහත්තුරු වෙනුවෙන් පෙනී හිටියා. අපි නගර සංවර්ධනයට පාර ලොකු කරන්න එපා කියලා කිව්වේ නෑ. මේ අයට යම් කිසි සහනයක් දෙන්න කියලා අපි කිව්වා. එවක සභාපතිවරයා විදියට හිටපු සුදත් මංජුල , අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මට නගරයේ ඔරලෝසු කණුව ගාවදි පැහැදිලිවම ප්‍රකාශයක් කලා. " උපාලි මන්ත්‍රීතුමා, තැඹිලි වල්ල විකුණපු මිනිහාටත් සාධාරණයක් කරනවා. කිසි කෙනෙකුට අසාධාරණයක් කරන් නෑ. ඔක්කොටම ගෙවනවා කිව්වා. හැබැයි කාටවත් ගෙවපු තැනක් නෑ. ඒවා වචන වලට විතරක් සීමා වුනා. ඒ නිසා මෙතන තියෙන ගැටළුව, මේ මුදල් ලබා ගැනීම නිසා සභාව ලොකු වරදක් කරලා තියෙනවා. වරද කරලා තියෙන්නේ කඩ හිමි නැති අයගෙන්, කඩයක් තියා, රට කජු ගොට්ටක්වත් තියාගෙන විකුණන්න තැනක් නැති අයගෙන් මුදල් අරන් තියෙනවා. කොයි ආකාරයෙන් කඩ දෙන්න ගත්තාද දන්නේ නෑ. හැබැයි අපි මේ සියළු මුදල් ආපහු ගෙවන්න ඕනි. මම නම් එතන ඉන්නවා. ඒ නිසා මේ මුදල් ගෙවන්න කියන යෝජනාව ඔබතුමා දැම්මා. එතුමාට විතරක් නෙමේ , මේ අයගේ සියළු මුදල් අපි ගෙවලා දාන්න ඕනි. අපි ඒ මුදල් තියා ගන්න එක නීති විරෝධියි. දිගින් දිගටම අපිට ඉල්ලීම් එනවා. කඩ දෙන්න කියලා. අපි කොයි අවස්ථාවක හරි කඩයක් දෙනවා නම් දිය යුත්තේ, හරියටම සුදුසු අය තෝරලා ඒ අයට පමණයි. එහෙම නැතිව list එකක් ඉන්නවා. ඒ අයට කඩ දෙන්න බෑ කොහොමවත්. එහෙම දෙන එක නීති විරෝධියි. ඒ නිසා ඒ මුදල් වහාම ගෙවීමට අපි කටයුතු කරමු. ඒ වගේම ඒ අයට මුදල් ගෙව්වට , ඒ අයට යම් දවසක සභාව තුලින් ඒ අයගේ ඒ අහිමි වෙච්චි කඩය වෙනුවට යම් කිසි මුදලක් අය කරලා කඩයක් ලබා දීමේ වගකීම අපිට තියෙනවා කියන එකත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනි.

මෙම ඇප තැන්පතු මුදල් ලබා ගැනීමට අදාල කාරණය ඉටු කිරීමට සභාව අපොහොසත් වී ඇති බැවින්, හා මෙම මුදල මගින් සභාව යම් පොළී ආදායමක් උපයා ගෙන ඇති බැවින්, හා යම් කිසි පොළී ආදායමක් අදාල මුදල් ( කීමනී ) තැන්පත්කරුට අහිමි වීම යන කරුණු සැලකිල්ලට ගනිමින් මෙම රු. 200,000.00 ක මුදල ආපසු ගෙවීමත්, මෙය පූර්වාදර්ශයක් කරගෙන ඉතිරි කඩ කාමර 17 ට අදාල කීමනී ( තැන්පතු මුදල්) මුදල් ආපසු ගෙවීමත් සුදුසුය යන ප්‍රකාශය සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2013 වර්ෂයේ ඉදි කරන ලද කඩ කාමර 17 හි අංක 03 කඩ කාමරයට අදාලව කීමනී වශයෙන් ලබා ගෙන ඇති රු.200,000.00 ක මුදලක් පොරොන්දු වූ පරිදි කඩ කාමර ලබා දීමට නොහැකි වීම මත ආපසු ගෙවන ලෙස ඉල්ලා නීතිඥ අයි.ඩී රංජිත් විජේසිංහ මයා විසින් රුවන්වැල්ල දිසා අධිකරණයේ අංක 1332 M නඩුව ගොනු කර ඇත. 2022.08.18 දින ගරු මහා සභාව මගින් අදාල මුදල ආපසු ගෙවීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමක්, අවශ්‍ය බවට තීරණය කර තිබුනි. ඒ අනුව 2022.10.25 වෙනි දින පලාත් පාලන කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාරතුමා අමතා මෙම ඉල්ලීම ඉදිරිපත් කලද , 2023.01.03 වෙනි දින පලාත් පාලන කොමසාරිස් විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වන වගන්තියේ සභා අරමුදල් වියදම් දැරීමේදි එකී වියදම් දරන කාරණයන් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බවට සඳහන්ව ඇතත් , මෙම ඉල්ලීමට අදාල කාරණය එවැනි ප්‍රතිපාදනයක් තුලට ඇතුලත් නොවන බවත්, එබැවින් මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට අවශ්‍ය නිර්දේශ ලබා දීමක් සිදු කල නොහැකි බවත් වාර්තා කර ඇත. එසේම මෙම ඇප තැන්පතු මුදල් ලබා ගැනීමට අදාල කාරණය ඉටු කිරීමට සභාව අපොහොසත් වී ඇති බැවින් හා මෙම මුදල මගින් සභාව යම් පොළී ආදායමක් උපයා ගෙන ඇති බැවින්, හා යම් කිසි පොළී ආදායමක් අදාල මුදල් ( කීමනී ) තැන්පත්කරුට අහිමි වීම යන කරුණු සැලකිල්ලට ගනිමින් මෙම රු. 200,000.00 ක මුදල ආපසු ගෙවීමත්, මෙය පූර්වාදර්ශයක් කරගෙන ඉතිරි කඩ කාමර 17 ට අදාල කීමනී ( තැන්පතු මුදල්) මුදල් ආපසු ගෙවීමත් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඊ.කාරක සභා වාර්තා

<u>ඊ - I</u>

<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටුව</u>

-නැත-

<u>ඊ - II</u>

<u>කාර්මික සේවා කමිටුව</u>

- නැත -

**ඊ - III**

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

- නැත -

**ඊ - IV**

පරිසර හා පහසුකම් කමිටුව

-නැත -

**ඊ - V**

ප්‍රසම්පාදන කමිටුව

-නැත -

උ.ආදායම් වියදම් වාර්තාව,ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික වාර්තාව,ගෙවීම් වාර්තාව,ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්වය පිලිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම

**2022** දෙසැම්බර් මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණයන්, ඒකාබද්ධ ගෙවීම් සාරාංශයන්, ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්ත්වයන් පිළිබඳ වාර්තාව, ගෙවීම් වාර්තාවන් ඉදිරිපත් කිරීම

**1.2022** දෙසැම්බර් මසට අදාල මාසික ගිණුම් වාර්තා ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම සඳහා සභා ගත කරන ලදී.

**උ - II**

**2022.12.31** දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය ගරු මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කිරීම

**2022.12.31** දිනට මූල්‍ය තත්වය

| බැංකුවේ නම | ගිණුම් අංකය | මුදල රු. ශත |
|---|---|---|
| මහජන බැංකුව, රුවන්වැල්ල | (පොදු ගිණුම) **081-1-001-3-4928744** | **17,975,592.19** |
| මහජන බැංකුව, රුවන්වැල්ල | (සේවක ණය ගිණුම) **081-1-001-7-4928780** | **923461.01** |

ස්ථාවර තැන්පත්

| | |
|---|---|
| මහජන බැංකුව - රුවන්වැල්ල | **40000000.00** |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, රුවන්වැල්ල | **1000000.00** |
| එකතුව | **62597329.85** |

ඌ **- 1.**නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නිවාඩු අවසරය

**2023.01.12** දින අසනීප නිසා මහා සභාවට නොපැමිණෙන බව දැනුම් දුන් ගරු උප සභාපති කේ.පී. රත්නපාල පීරිස් මහතාට හා ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී.වෛද්‍යරත්න මහතාට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා යෝජනා කල අතර, එම යෝජනාව ආර්.පී සිරිපාල රත්නායක මහතා ස්ථිර කරන ලදින් , එම දෙදෙනාට නිවාඩු අනුමත කරන ලදි.

ඌ **- 11.**පසුගිය සභා රැස්වීමේ කටයුතු සම්බන්ධයෙන් වූ ප්‍රගතිය සලකා බැලීම

- නැත -

ඌ **- 111.**මන්ත්‍රිවරුන්ට පවරා ඇති අධීක්ෂණ කාර්යයන්හි ප්‍රගතිය දැක්වීම

- නැත -

ඌ - 1V.මන්ත්‍රිවරුන්ගේ අදහස් දැක්වීම

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

එළඹෙන අවුරුද්ද සුභ අවුරුද්දක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. පහුගිය දිනක රාජකාරි කටයුත්තක නියැලිලා ගෙදර යන ගමන් හදිසි අනතුරකට ලක් වෙලා මිය ගිය සුනිල් සහෝදරයාගේ අභාවය පිලිබඳ මන්ත්‍රිවරයෙක් විදියට කණගාටුව ප්‍රකාශ කරනවා. කරුණාරත්න මන්ත්‍රීතුමා කිව්වා වගේ අරමුදලේ යම් මුදලක් ඉතුරු වෙලා තියෙනවා නම් මම යෝජනාවක් හැටියට ගේනවා විසුරුවනකන් මන්ත්‍රිවරයෙක්ට අවශ්‍යතාවයක් වුනොත් දෙන්න යම් මුදලක් ඉතුරු කරගෙන, විසුරුවන දවසක කාලා බීලා අපි සතුටු වෙනවට වැඩිය ඒ අහිංසක දරු පවුල වෙනුවෙන් ඉතුරු වෙලා තියෙන හැත්තෑ හත් දහසක මුදලද, තව මුදලක් අතින් දාලා ලක්ෂයක මුදලක් හදලා ඒ දරු පවුල වෙනුවෙන් පරිත්‍යාග කරමු කියලා . කාලා , බීලා ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙන කාලයක් මේ. අහිංසක දරු පවුලක් අනාථ වෙලා තියෙනවා මම දැක්කා. ප්‍රාදේශීය සභාව හැටියට ලොකු මෙහෙවරක් අපේ නිලධාරි මහත්තුරු කලා. මම අවමංගුල් උත්සවයට සහභාගි වෙච්චි වෙලාවේ දැක්කා. සෑහෙන පිරිසක් ඒ මළ ගෙදරට ආවා. කවුරු මොනවා කිව්වත් , ජීවිතේ එතුමා පතාගෙන ආපු විදියට එතුමාට අවසන් ගමන් යන්න සිදු වුනා. අහිංසක දරුවෝ දෙන්නෙක් ඉන්න පවුලක්. ඒ නිසා මම මන්ත්‍රිවරුන්ට යෝජනාවක් හැටියට කරනවා , සියළු දෙනා සද්භාවයෙන් එකතු වුනොත් යමක් කල හැකියි. මේ සුභ සාධකයේ ඉතුරු මුදල වුනත් කමක් නෑ. අහවල් දවසේ ප්‍රාදේශීය සභාව විසුරුවනවා. අපි සියළු දෙනා කැමැත්තෙන් මේ මුදල දෙනවා කියලා අපි යෝජනාවකට එමු. මම ගිය සැරේ සභාවෙදි ඉල්ලීමක් කලා. මන්ත්‍රිවරුන්ට සහ මන්ත්‍රිවරියන්ට අයවැයෙන් දුන්නු ලක්ෂයේ ප්‍රතිපාදන වලට මොකද වුනේ කියලා , මම ලේකම් මහත්තයාගෙන් ලිඛිතව ඇහුවා. නමුත්, අපිට තාම ඒක ලැබුනේ නෑ. අපිට තාම ලයිට් 05 න්, 1 ක්වත් ලැබුනේ නෑ. ලක්ෂයෙන් කර ගන්න තියෙන බැකෝ යන්ත්‍රයවත් ලැබුන් නෑ. ඒක පුන පුනා කියන්න දෙයක් නෙමේ. හෙට විසුරුවත් නැතත් , මම ලේකම්තුමාට බලය තියෙනවා නම් අපේ ලක්ෂයේ ප්‍රතිපාදන මුදලට දෙන දෙයක් ලබා දෙන්න කියලා කිව්වා. හෙට ඉදලා වුනත් ලක්ෂ 03 ක් දෙන්න පුළුවන්. සභාවේ 2023 අයවැය සම්මත කරලා තියෙනවා. ඒකත් ගම් වලට දෙනවා නම් , ඡන්දෙට වැඩ කරන්න හරි සභාපතිතුමාට කුළුපග කට්ටියට දෙන්න පුළුවන්. අපි විරෝධතා කඳවුරේ කියලා අපිට නම් තාම ලක්ෂය නෑ. මට ආරංචියි ඔබතුමාට ඊයේ පෙරේදා ගිහිල්ලා ඔබතුමාගේ කොට්ඨාශයට ලයිට් දුන්නා කියලා ආරංචියි. සන්තෝෂයි. එහෙම තමයි වෙන්න ඕනි. අයවැයට සහයෝගය දක්වපු කට්ටියට සහයෝගය දෙන්න එපැයි. අපි සහයෝගය නුදුන්න නෙමේ. අපිට ඒ අයවැයත් එක්ක එකතු වෙන්න බෑ. අපි විරෝධ කඳවුරේ හිටපු නිසා අපි අයවැය දවසේ සහයෝගය දක්වන්න ආවේ නෑ. අපි 08 ක් ආවේ නෑ. ආවා නාවා වෙනම දෙයක්. අයවැය සම්මත වෙලා තියෙනවා. සභාවේ කටයුතු ඉස්සරහට කරගෙන යන්න පුළුවන්. ලක්ෂ 03 ක් දෙන්න පුළුවන් මන්ත්‍රිවරයෙකුට. අපිට ලැබෙන්න තියෙන මුදල් අපිට ලැබෙන්න ඕනි. ඒ නිසා ලේකම්තුමා ඒ පිලිබඳව අවධානය යොමු කරන්න. අපෙත් විදුලි පහන් අළුත් වැඩියා කරන්න තියෙනවා. මං අද එනකොටත් අපේ කොට්ඨාශයේ ලයිට් පිච්චිලා කියලා කිව්වා. මම කකුල් දෙක ගාවට ඇවිල්ලා , අනේ සභාපතිතුමා මේක දෙන්න කියලා කියයි කියලා හිතේ තියෙනවා නම්, ඒක නෙමෙයි විය යුත්තේ. සභාවේ අපේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව තියෙනවා. අපිට ලැබෙන්න තියෙන ප්‍රතිපාදන ලැබෙන්න ඕනි. අපිත් ඡන්දෙන් දිනලා ආව මන්ත්‍රිවරුනේ. අපිට ඒ අයිතිය තියෙනවානේ. එක කණ්ඩායමකට එක විදියටකට බෙදනවා නම්, තව කණ්ඩායමකට තව විදියකින් බෙදනවා නම් , ඒක ලොකු අසාධාරණයක් හැටියට මම දකිනවා. ප්‍රාදේශීය සභාව අද විසුරුවයි හෙට විසුරුවයි කියලා අපි බලාගෙන ඉන්නවා. නාම යෝජනා කැඳවලා තියෙන මොහොතක අපි සභාව රැස් වෙලා තියෙනවා. අපි මේ අනර්ථයක් කරන්නේ. මහජන මුදල් මේ තියෙන්නේ. ප්‍රාදේශිය සභාවක් හැටියට කිසිදු රාජකාරි සේවාවක් වෙන් නැති මොහොතක , මේ වර්ෂයේ පලවෙනි සභා වාරය වුනත් කැඳවලා ප්‍රාදේශීය සභා විසුරුවන්න තියෙන වකවානුවක මේ මන්ත්‍රීවරුන්ගේ දීමනාවක් හරි ගෙවලා , සල්ලි නෑ සල්ලි නෑ කියන වෙලාවක , ඡන්දයක් සුදුසු වෙලාවක් නෙමේ. මේක විසුරුවලා කොමසාරිස් පාලනයකට මේක ආණ්ඩුව පත් කරන්න ඕනි. විශේෂයෙන්ම හැම සභාවකම මේ වගේ ගැටළු තියෙනවා. අපි අවුරුදු 05 ක වගේ කාලයක් මේ සභාවේ මන්ත්‍රි තනතුරේ වැඩ කරනවා. අවුරුද්දක කාලයක් පලාත් පාලන ඇමතිවරයාගේ බලතලත් එක්ක මේ මන්ත්‍රිවරයාගේ ධූර කාලය ඉදිරියට ගෙනල්ලා තියෙනවා. මේක විසුරුවන්න ඕනි කාලය ඇවිල්ලා තියෙනවා. මොන පක්ෂයකින් තරඟ කර හෝ නොකර හෝ ආවා හෝ නාවා මහජන මතයට ඡන්දයකට යන්න තියෙන යුගයක ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරයෙක් හැටියට අපි සියළු දෙනා එකතු වෙලා ආව මේ ගමනෙදි , පෙබරවාරි මහා සභාවෙදිත් අපි හම්බෙන්න ඉඩ තියෙනවා. අද හෝ විසුරුවන්නත් ඉඩ තියෙනවා. මොන අඩුපාඩු තිබුනත් අපි එකට ආපු ගමනක් තියෙනවා. ඒ කාලෙදි මගෙන් අතපසු වීමක්, හිත් තැවිල්ලක් වුනා නම් සමාව භජනය කරමින් , ලැබුවා වූ නව වසර කිරියෙන් පැණියෙන් ඉතිරෙන නව වසරක් වේවායි පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා</u>

අපි බලාපොරොත්තු වෙන දේවල් ඉදිරියේ සිද්ධ වෙන්නේ නෑ. ආණ්ඩුව පුළුවන් තරම් මැතිවරණය නොතියා ඉන්න උත්සාහ දරනවා. එයාර් ලංකා ආයතනයේ හෙම මාස 03 ක පඩි දීලා. මාස 13 අවුරුදු තියෙන්නේ කොයි කාලෙද දන්නේ නෑ. මේක යම රජ්ජුරුවන්ගේ ආණ්ඩු කාලයක්. මාස 13 පඩියකුත් දීලා. ඒ වගේ රට බොරු කියන , මැතිවරණයෙන් ඉවත් වෙන්න කරගෙන යන උප්පරවැට්ටියක් තමයි මේ කරගෙන යන්නේ. මේකේ ප්‍රතිඵලය ඉදිරියේදි කාට කාටත් හම්බ වෙයි. කාටවත් සභාවක් , පාර්ලිමේන්තු ආණ්ඩුවක් පිහිටු වන්න ලැබෙයි කියන්න බෑ මේ විදියට ගියොත්. මේක හතර අතේ කැඩිලා. 69 ලක්ෂේ හතර පස් පොලකට කැඩිලා. අලියා තව හතර පස් පොලකට කැඩිලා. ඔය විදයට තියෙන්නේ. මට නම් මේ ඡන්දත් එපා වෙලා. රනිල් වික්‍රමසිංහ මහත්තයාට පළු යන්න බැනපු අය , එයාට වැඩිය හොඳ මිනිහෙක් නෑ කියලා දැන් අඟේ කරනවා. රනිල් මහත්තයාගේ ආණ්ඩුවේ මිනිස්සු හිටියා , මහ බැංකුව කාපු පල් හොරා කිව්වා. පාස්කු ප්‍රහාරයට අනිවාර්යයෙන්ම අත් අඩංගුවට ගන්න ඕනි කිව්වා. අත් අඩංගුවට ගැනිලුත් නෑ. හොරකමත් නෑ. ඊට වඩා හොඳ මිනිහෙක් නෑ. අපි මේ කා එක්කද කථා කරන්නේ. අපි මේ 30 නා රණ්ඩු වෙන්න අවශ්‍ය නෑ. රත්නපාල පීරිස් උප සභාපතිතුමා අද අවශ්‍යම පුද්ගලයෙක්. අද ඇවිදින් නෑ. නැත්නම් අපේ නවරත්න මන්ත්‍රීතුමා එක්ක මේ අපි හේද බින්න කරපු එකත් මං කියන්න හිටියේ. අපි හේද කරපු එක ඊගාව සභාව තිබුනොත් මං ආයේ කියනවා. එයා ඉස්සරහම ඒක කියන්න ඕනි. අපිව හේද බින්න කරපු පලවෙනි පුද්ගලයා නැතුව කියලා වැඩක් නැනේ.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

දෙවෙනි එක්කෙනා ඉන්නේ , කියන්නකෝ.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා</u>

දෙවෙනි එක්කෙනා එක්ක කියලා බෑ. ඔයා කථා කරන්න එපා සභාපතිතුමා. හිටපු සභාපතිතුමා තමා අපිට මේ ලුණුව දුන්නේ. එයා එක්ක තමා කියන්න ඕනි. දැන් සභාපතිතුමාටත් ඇණ උල් කරලා දුන්නේ මෙයා. මං එදා කිව්වේ , ඇල් වතුරින් කැවුම් උයන මිනිහෙක් කියලා. ඒ කථාව ඇත්ත. මං උයන හැටිත් කියලා දෙනවා. අද නෑ. ඉස්සරහ තියාගෙනක තමයි කියන්න හිටියේ. අද එයා නෑ. තමුන්නාන්සේලාට 2023 වර්ෂය කාටත් සතුටින් හම්බ වෙලා කථා කරන්න පුළුවන් සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

සුභ සාධක ඉතුරු මුදල් ඒ දරු පවුල වෙනුවෙන් දෙනවා නම් හොඳයි. අපේ නිලූකා මන්ත්‍රීතුමිය යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුනා. මේ මුදල් යොදවලා ළමයිට පොත් අරන් දෙමුද කියලා. ඒකත් හොඳ යෝජනාවක්. නමුත්, ප්‍රශ්නයක් තියෙනවා. මෙතන මන්ත්‍රීවරු 30 ක් ඉන්නවා. මේ මන්ත්‍රීවරු 30 නා අතරෙම ඒක බෙදෙන්න එපෑ. මේ අසූ හය දාස් ගාණට ගැලපෙන්න අඩු ගානේ ළමයි 10 – 15 කටවත් දෙන්න පොත් ගන්න බෑ. ඒ නිසා එහෙම වුනොත් අපි අතරේ තව ප්‍රශ්න ඇති වෙනවා. ඒක හොඳ යෝජනාවක්. නමුත්, කරන්න අපහසුයි. ඒ නිසා මංජුල නවරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අදහස හොඳයි. ඒක යෝජනා කරලා මට කැමැත්ත ඒකමතිකව දෙන්න. එතකොට හදිස්සියේ විසුරෙව්වොත් , ඒ විසිරෙව්වාට පස්සේ අපි සභාපතිතුමත් එක්ක එකතු වෙලා , අනිත් අයත් දැනුවත් කරලා , වාර්තාවක් හදාගෙන අපිට මේ මුදල අර ගන්න පුළුවන්. අරගෙන අනික් අයට දන්වන්න පුළුවන්. ඒ නිසා ඒ ගැන එකඟද කියන එක කියන්න.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

විසුරුවනකම් ඉන්න.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

ඒකට කැමති නම් අපි අත් ඔසවලා කැමැත්ත කියමු. ඉතිරි මුදල අර නැති වුන කෙනාගේ පවුලට දෙන්න කැමතියි කියන අය අත් උස්සන්න. ( හැමදෙනාම සිය අත් එසවා කැමැත්ත ප්‍රකාශ කරන ලදි. ) එතන ඉගෙන ගන්න ළමයි දෙන්නෙක් ඉන්නවා. ඒ ළමයි දෙන්නත් එක්ක ලොකු අසරණ තත්ත්වයකට එනවා. එහෙම වුනොත් තව රුපියල් දහ තුන් දාස් තුන්සීයක විතර මුදලක් අඩු වෙනවා ලක්ෂයකට. ඒක ලබන මාසේ තිබුනොත් ගත්ත හැකි. නැති වුනොත් මේ මුදල අපි දෙමු. ගොඩක් ස්තූතියි. සුභ සාධක සංගමය හැටියට ඒ තීරණය අර ගන්නවා සභාපතිතුමා. කවදා විසිරෙයිද? ඡන්දේ තියයිද අපි දන්නේ නෑ. ඒ මොනවා වුනත් කමක් නෑ. ඒ දේවල් වලට අපි සූදානම් වෙන්න වෙනවා. ප්‍රාදේශීය සභාවක් හැටියට මීට වඩා ක්‍රමවත්ව මන්ත්‍රීවරුන්ගේ අදහස් එකතු කරගෙන ඉදිරියට යන වැඩ සටහනක් ප්‍රාදේශීය සභාවක ක්‍රියාත්මක විය යුතු වෙනවා. මම නම් අදහස් කලා , අපේ සභාපතිවරුන්ටත් මම මුල ඉදම යෝජනා කලා. සියළු කණ්ඩායම් නායකයන්ගෙන් හැදිච්ච කණ්ඩායම් රැස්වීමක් ගන්න කියලා මම කිව්වා. කණ්ඩායම් රැස්වීමෙදි සාකච්චා කරලා , සභාවට එනවා නම් සභාවේ හැම කටයුත්තක්ම ඒකමතිකයි. සියළු දෙනා දැනුවත්ව ඒකමතිකයි. අපි ඒකමතික කිව්වට සමහර අය මොකක්දවත් දන්නේ නෑ. මීට වඩා ක්‍රමවත් , හොඳ කලමනාකරණයක් තියෙන සභාවක් මින් ඉදිරියට බිහි වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අපේ පනත අනුව ගොඩක් බලතල අපේ ප්‍රාදේශීය සභාවට තියෙනවා. සියල්ල දැනගෙන ඇවිල්ලා අපි ක්‍රියාත්මක

කරන්න උත්සාහ කරන්නේ නෑ. උදාහරණයක් හැටියට මම යෝජනා කලා , එකපාර වරිපණම් බදු වැඩි වුනාම , ඒ අපහසුවට 2%කින් කපා හරිමු කියලා. හැබැයි ඒ වෙලාවේ දිගින් දිගටම කිව්වේ වැඩි කරපුව අඩු කරන්න බෑ. පනත යටතේ එහෙම ප්‍රතිපාදනයක් නෑ. අපි හැම අවුරුද්දකම අනුමත කරනවා. නමුත්, අපි ඒ වෙනුවෙන් සටන් කරලා නෑ. නාගරිකව 7%ක් වරිපණම් අය කරනවා. හැබැයි අවට ඉන්න බොහෝ මන්ත්‍රීවරු දන්නවා , රුපියල් දහ පහලොස් දාහ වරිපණම් ගෙවන අය ඉන්නවා. නාගරික කොටස හරිම පීඩාවකට පත් වෙලා තියෙනවා. අනික් අය කොතරම් වත්කම වැඩි වුනත් 5% යි ඒ අයගෙන් අය වෙන්නේ. එතකොට නාගරිකව ඉන්න අය තමයි අපහසුවට පත් වෙන්නේ. හැමදේම කඩෙන් ගන්න ඕනි. සමහර විට මේ රජයේ සේවකයෝ. ඒවගේ අයට තියෙන අපහසුව නිසා , ඒ වගේ අපි උත්සාහයක් දරලා නෑ, සාධාරණ බදු ප්‍රතිපත්තියකින් ඒ බදු වැඩි කරනකොට ඒ බර මිනිස්සුන්ට වැඩි නොකර හරි යන්න. එකතු කරන බදු මුදල් නිසි පරිදි වියදම් වෙනවද කියලා වත් අපි හොයා බලලා නෑ. හැබැයි ඉදිරියේදි නම් එහෙම වෙන එකක් නෑ. ඉදිරියේදි වරිපණම් බදු ගෙවන්නන්ගේ සංගම් බිහි වේවි. ජනතාවට මේ පීඩාව වැඩි වෙනකොට ජනතාව තමුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් තනියෙන් ඉදිරිපත් කරලා විසඳුම් ගන්න බැරි වෙනකොට , ඒ අය සංවිධානය වෙනවා. ඒ නිසා අපි හිටියත් නැතත් ඒ වගකීම ඉෂ්ට කරන්න මේ සභාවට ශක්තිය , ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අනිත් කාරණය තමයි , මංජුල නවරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අදහස. ඇත්තෙන්ම අයවැයෙන් මන්ත්‍රීවරයෙක්ගේ යෝජනා වෙනුවෙන් මුදල් වෙන් වුනාට පස්සේ , ඒ මන්ත්‍රීවරයාගේ යෝජනාව සභාවට අර ගත්තා නම් හොඳයි. අපිට 2023 යෝජනාත් දෙන්න කිව්වානේ. 2023 යෝජනාත් දුන්නානේ. හැබැයි දැන් ජනවාරි ඉදලා ඒ දීපු යෝජනා , මන්ත්‍රීවරයා කවුද කියන එක නෙමෙයි අවශ්‍ය. සභාවට ආපු යෝජනා කාර්මික නිලධාරි මහත්තුරුන්ට දීලා , ඇස්තමේන්තු හදලා ඒ වැඩ පටන් ගන්න ඕනි. ඒ ක්‍රියාවලිය දිගට යන්න ඕනි. මේ ලැබෙන යෝජනා අනුව ප්‍රමුඛතාවය දිලා , පුළුවන් දේවල් කරන්න උත්සාහ කරන්න ඕනි. ඒ නිසා මේ දැන් ඉදලම, මොකද ගෝණගල්දෙණියේ කාරණයට අයවැය මුදල් වෙන් වුනා. මං හිතනවා, ස්ලැබ් එකක් ගහලා පාරේ මට්ටමට ඉදි කරනවා කියලා. හොඳ සැලැස්මක් ඇතුව ඒ කාරණය කරනවා නම් හොඳයි. යෝජනාවක් සම්මත වුනා . ඊළඟ සතිය වෙනකොට වැඩ පටන් ගන්න පුළුවන් නම් උත්සාහ කරන්න. එතකොට සභාවට ගෞරවයක් තියෙනවා, සභාව විසින් මෙහෙම වැඩක් හරි කරා කියලා. 2022 ලක්ෂය ගියානේ. ඒ ලක්ෂය ආපහු දෙන්න පුළුවන් විදියට සකස් කරනවා කියලා ඔබතුමා කිව්වා. ඉතින් එහෙම පුළුවන්කමක් තියෙනවා නම් , මම දන් නෑ. ආරම්භ කරපු වැඩක්, බාගෙට ගිය වැඩක් නැවතුනොත් ඒක අපිට නැවත ගන්න පුළුවන් කියලා. හැබැයි එහෙම පුළුවන්කමක් තියෙනවා නම්, ඒවත් අරන් ඒ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ලැබුන ඒවා ඇස්තමේන්තු කරන්න කියලා ඉල්ලනවා. මම නම් ආරම්භයෙදි හරි රු.50,000.00 වැඩ කර ගත්තා. සමහර මන්ත්‍රීවරු ඒ පනස් දාහේ කාර්යයවත් කරගෙන නෑ. මේ අවුරුදු 04 ටම එකම වැඩක්වත් සභාව වෙනුවෙන් කර ගත්තේ නැති මන්ත්‍රීවරු සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවා. ඒක නිසා අපි ඉක්මන් කරලා, ඒක වෙනුවෙන්වත් යමක් කරන්න පුළුවන් නම් , හොඳයි කියන අදහස ඉදිරිපත් කරනවා. සභාවේ සේවක මණ්ඩලය එකතු වෙලා සේවකයෙක් වෙනුවෙන් කටයුතු කලා. මන්ත්‍රීවරු හා අනික් සියළු දෙනාගේ හිත දිනා ගනිමින් , ක්‍රීඩා පිටියේ කටයුතු වලදි හොඳ සහයෝගයක් ලබා දෙමින් හොඳින් වැඩ කරපු පුද්ගලයෙක් තමයි ඒ පුද්ගලයා. ඒ පවුලේ අයගේ කටයුතු වලට සහයක් හැටියට අපිට කිසිම දෙයක් කරන්න බැරි වුනා. අපි ගිහිල්ලා ආවා විතරයි. මේ සුභ සාධක සමිතියේ මුදල වැය කරන අතරම, ඉල්ලීමක් කරනවා. මේ සභාවේ ශෝකය පල කිරීමේ යෝජනාවක් අපි ඒ නිවසට යවමු. සියළු දෙනාටම මේ ලැබූ නව වසර වාසනාවත්න , බලාපොරොත්තු ඉෂ්ට වෙන වසරක් වෙන් කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී පී.ඒ සරත් මහතා</u>

සියළුම දෙනාට ලැබුවා වූ 2023 වසර සුභ නව වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. අපි මේක විසුරුවයි කියලා බලාපොරොත්තු වෙලා ඉන්නවා. මට ජේන හැටියට නම් මේ මාස 03 මේ විදියටම යනවා. අපිට ඒ නිසා වාර 02 ක් විතර තියෙනවා. විසුරුවනවා කියන තැන ඉන්නේ නැතිව අපිට තව වැඩ කොටසක් කරන්න පුළුවන්කම තියෙනවා. මේ ප්‍රාදේශීය සභාව ගත්තහම වරිපණම් සීමාවට තමයි ගොඩක් සේවාවන් යන්නේ. ගම් ඇතුලට ගියාම අපිට ලොකු දෙයක් කරන්න නෑ. උපරිම දේ ලයිට් එකක් දාන එක. ඉස්සර නම් අපි ලයිට් එකක් දැම්මා. බෝක්කුවක් බැන්දා. පාරවල් සුද්ධ කලා. දැන් එහෙම කරන් නෑ. එහෙම කරන්න සේවකයොත් නෑ. ඒ හින්දා මම ඔබතුමාගෙන් ඉල්ලනවා , මේ එන ටික දවසවත් යමක් කරමු. උප නගර ටික ආසන්නව ඉන්න අයට වැඩ කොටස් කෙරෙනවා. නමුත්, ගම් ඇතුලට යනකොට ලොකු දෙයක් කරන්නේ නෑ. යම් කිසි වැඩ සැලැස්මක් හදලා ගම ඇතුලටත් වැඩක් වෙන දෙයක් කරන්න. අඩුම ගානේ ළිඳක් බැඳලා දෙන්න. බෝක්කුවක් හදලා දෙන්න වැනි වැඩ පිලිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලනවා. ගෝණගල්දෙණිය සතිපොල බැම්ම උඩින් ස්ලැබ් එකක් ගහලා කරන්න හදන ඉදි කිරීම සම්බන්ධව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉස්සෙල්ල අපේ සුදත් මංජුල මන්ත්‍රීතුමා ඉන්නකොටත් මම ඒක කිව්වා. ගෝණගල්දෙණිය නගරය ආර්ථික පැත්තෙන් ඉහලට ගන්න අවස්ථාවක් වෙනවා. බැංකු කීපයක් තියෙනවා. යම් යම් හේතු හින්දා මේක සිදු වුනේ නෑ. ඉඳුරානේ සිරිපාල මන්ත්‍රීතුමා, නිශාන්ත කරුණාරත්න මන්ත්‍රීතුමා, රාජා හතරසිංහ මන්ත්‍රීතුමා, මම , මේ හතර දෙනාම එක් රොක් වෙන්නේ ගෝණගල්දෙණියට. මේ වෙනකල් සභාවෙන් කියලා ගෝණගල්දෙණියට දෙයක් කර ගන්න බැරි වුනා. ඒකට එක එක හේතු පාදක ඇති. ඔබතුමා අයවැයටත් ඒ යෝජනාව දැම්මා. අද ඒක සම්මත වෙලත් තියෙනවා. ඒ

ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ මොකද ගෝණගල්දෙණිය, අම්තිරිගල, ගලපිටමඩ කියන නගර වලටත් පොඩ්ඩක් දැනෙන්න ඕනි. රුවන්වැල්ලේ සභාවක් තියෙනවා. මේ නගර වලටත් යමක් වෙනවා කියන එක හොඳයි. කේන්ද්‍රීය නගරය රුවන්වැල්ල. මේ වැඩ සටහනේ නීති පැත්තේ සියළු දේ වෙලා ඉවරයි. මාර්තු වෙනකල් මේ සභාව යනවා. ඊට පස්සේ ස්වභාවිකව මේක විසිරිලා යයි. ඉස්සරහට යනවා නම් පාර්ලිමේන්තු අනුමැතියක් අරන් කරයි. ඒ වෙනකල් අපි මේ වැඩේ පටන් ගමු කියලා මම කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලන ගමන්ම සියළු දෙනාටම ලැබුවා වූ වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රාදේශීය සභාවේ සේවකයෙකු වශයෙන් කටයුතු කල හදිසි අනතුරකට ලක් වෙලා අපි අතරින් වියෝවූ සුනිල් මහත්මාට සංවේගය මේ අවස්ථාවේ පුද කරනවා. මේ අවස්ථාවෙදි 2023 නව වසර උදා වෙලා පලවෙනි සභා වාරය. සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රිවරුන්ටත්, ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ලැබුවා වූ නව වසර දුක් , කම්කටොලු නැති සෞභාග්‍ය වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. මේ අවස්ථාවේ මම කියන්න ඕනි සභාපතිතුමනි, අපි සිටි කාල වකවානුව තුල , එනම් මේ අවුරුදු 05 ම ගෙවිලා ගියේ ප්‍රයෝජනවත් නැති විදියට. ඒක අපි පිලි ගන්නවා. ඒක අපේ වරද විතරක් නෙවේ. කොමසාරිස්තුමා ඉදලා ආණ්ඩුකාරතුමා ඉදලා, මේ පනත් හදපු අයගේ ඉදලා වරද මං කියන්නේ. සභාව ආරම්භ වෙනකොටම මේ අර්බුදය ආරම්භ වෙලා තිබුනේ. ක්‍රමවේදයේ වැරැද්දක් තියෙන්නේ. ඒ නිසා තමයි සභාවට මෙහෙම වුනේ. මේ ක්‍රමවේදය වෙනස් විය යුතුයි කියන තැන අපි ඉන්නවා. ක්‍රමය වෙනස් වෙනවා කියලා ඡන්දය කල් දාන්න කියලා අපි කියන්නේ නෑ. වෙනස් වෙලා ඡන්දය වෙනවා නම් හොඳයි. පහුගිය කාලේ 15 ක් දිනුවා පොදු ජන පෙරමුණ. මන්ත්‍රිවරු 15 ක් ආවා. විපක්ෂයෙත් 15 ක් ආවා. එහෙම සභා කරන්න බෑ. ආරවුල් ඇති වුනේ ඒ පනත එක්ක ආපු මැතිවරණය එක්ක. ඒ නිසා අපි මේවා වෙනස් වෙන්න ඕනි තැන ඉන්නවා. ඒ එක්කලාම මම ඔබතුමාට මතක් කරන්න ඕනි , අපි එදා කමිටුවෙදිත් කථා කලා. ගිය සභාවෙදි කථා වුනා. ඊට පස්සේ රුවන්වැල්ල සතිපොල ටෙන්ඩර් දාන්න ටෙන්ඩර් කමිටුවෙදිත් කථා වුනා. නැවත ගවමස් කඩ ඇති කරන්න. ඊයේ පෙරේදා වෙනකොට මං හිතන්නේ ඒවා ක්‍රියාත්මක වෙලා ඇති. ඒක දැන ගන්නත් කැමතියි. තව දැවෙන ප්‍රශ්නයක් තමයි කාලයක ඉදලා , ලුම්බිණි මන්ත්‍රිතුමියගේ කොට්ඨාශයේ ඉඩමේ ප්‍රශ්නය. අපේ මයිකල් විජේවීර සභාපතිවරයා ඉන්නකොට තමයි ඒ ඉඩමට හානි වෙලා තියෙන්නේ. ප්‍රාදේශීය සභාවේ ඉඩමේ පස් ඉවත් කරන්න ගිහිල්ලා බැකෝ යන්ත්‍රය යොදලා. ඒ අය දිගින් දිගට ඉල්ලීම් කලා. ගිහිල්ලා බලලා එනවා. කරලා නෑ. අන්තිමටම රත්නපාල උප සභාපතිතුමා , සභාපතිතුමා විදියට ඉන්නකොට , එතුමාගේ හොඳ මිත්‍රයෙක් , ඒ ගෙදර අය. පොරොන්දු වෙලා ඇවිල්ලා තියෙනවා ඒ දේ කරලා දෙනවා කියලා. ලොකු වැඩක් එතන කරන්න නෑ. පස් ටිකක් ගිහිල්ලා දැම්මා නම් ඒ අය උර වලින් ඒක දා ගනී. ඒකයි තියෙන ප්‍රශ්නය. දැන් මේ වෙනකොට මං යෝජනාවක් දාලා ඒක සභා සම්මත වුනා. ඒකට To වාර්තාව ගෙනත් දීලා තියෙනවා. හැබැයි අද වෙනකන් ඒක ක්‍රියාත්මක වුනේ නෑ. පෙරේදා මට කථා කරලා කිව්වා. නීතිඥ මහත්තයෙක් හම්බ වෙලා සභාවට එන්තර වාසියක් එවනවා කියලා. තවත් නඩුවකට අපි යනවා. ඒකට පස් කපන්න බංගලිවත්තේ නොමිලේ ඉඩමකුත් හොයාලා දීලා තියෙන්නේ. ඒ ඉඩමේ අයිතිකරුගේ නම සහ විස්තරත් දීලා තියෙනවා. පස් කියුබ් 20 කට එහා කපා ගන්න පුළුවන්කමකුත් තියෙනවා. තව නඩුවකට යනවද ? එයාලා එක්ක නඩුවකට ගියොත් අපි පරාදයි. අපි සභාවේ පිලි අරන් තියෙනවා , මෙහෙම සිද්ධියක් වුනා , ඒක කරලා දෙනවා කියලා අවස්ථා ගණනාවකදිම පිලි අරන් තියෙනවා. ඒ ගැනත් මම සිහිපත් කරනවා. ලබන මාසේ වෙනකොට තව නඩුවක් අපිට එනවා. 2019 මම යෝජනා කලා අපේ හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු වන දිවංගත පී.සී ඉඹුලාන මැතිතුමාගේ නමින් බෝපැත්ත එතුමාගේ නිවස දක්වා යන මාර්ගය පී.සී ඉඹුලාන මහත්මාගේ නමින් නම් කරන යෝජනාවක්. යෝජනාව සභා සම්මත වුනා. ඒක පලාත් සභාවට යැව්වා , වෙච්ච් දෙයක් නෑ කියලා කාලයක් තිස්සේ කිව්වා. ගිහිල්ලා බලනකොට 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මාසේ වෙනකොට ඒක අනුමත වෙලා ඇවිල්ලා තියෙනවා. දැන් ඒකට කාලයක් ගත වෙලා තියෙනවා. අනුමත කරලා තියෙනවා. ගැසට් කරලා තියෙනවා. දැන් පී.සී ඉඹුලාන මැතිතුමාගේ නමින් ඒ මාර්ගය නම් කරන්න පුළුවන්. මේ කාලය අවසන් වෙන්න ඉස්සර වෙලා සභාවේ මන්ත්‍රී මණ්ඩලය සම්බන්ධ කරගෙන අපි චාම් විදියට පොඩි උත්සවයක් කරලා එතන නාම පුවරුවක් විවෘත කරමු කියලා මම යෝජනා කරනවා. එතුමගේ දේශපාලනය ගැන කවුරුත් දන්නවා. මේ වෙලාවේ එතුමාගේ නමින් දේශපාලනය කරන්න බලාපොරොත්තු වෙන් නෑ. අපි සියළු දෙනා එකතු වෙලා මේ කාර්ය කරමු. අඟුරුවැල්ල ළමා උද්‍යානයේ පවුලක් අනවසරයෙන් පදිංචි වෙලා ඉන්නවා. මේ පිලිබඳව දිගින් දිගටම කථා කලා. ඒකට සෘජුව මැදිහත් වුනේ අපේ හිටපු සභාපති මංජුල නවරත්න මැතිතුමා. අපි ගිහිල්ලා ඒකට සම්බන්ධ වෙලා , ඒ අයට ඉඩමක් දුන්නා. ඒ අය යන්න කැමති වුනා. සභාවෙන් ඒ අයට අවශ්‍ය උපකරණ දෙන්න කැමති වුනා. හැබැයි ඒක එතනින් එහාට ක්‍රියාත්මක වුනේ නෑ. එතුමාගේ ධුර කාලය අවසන් වෙනකොට , අපි subject එකෙන් අහනකොට එයා කිව්වා , ඒ ගැන දැනුවත් වීමක් වුනේ නෑ කිව්වා. ඒවා ලොකු වැරැද්දක්. සභාපතිතුමයි, කරුණාරත්න මන්ත්‍රීතුමයි , මමයි , ලේකම්තුමියයි ගිහිල්ලා බලලා ආවා. අපිට subject එකට කියන්න බෑ, අපි ඉඩම බලන්න ගියා. ඒ අයට ඒක දෙන්න අපි කියන්න ඕනි නෑ. ලේකම්තුමිය ගියානේ. Subject එක දැනුවත් වෙලා නෑ කිව්වා. ඉන් එහාට කිසි දෙයක් ඒකේ වෙලා නෑ. මේ ළඟදි දවසකදි සභාපතිතුමයි, මමයි දෙන්නා පන්සලක උත්සවයක ඉන්නකොට පොලිස්

ස්ථානාධිපතිතුමා එම ස්ථානයේ සිද්ධ වෙන දේවල් ගැන අප්‍රසාදය පල කලා. එතන සිද්ධ වෙන දේවල් ගැන පොලිසියටත් ගැටළුවක් තියෙනවා කිව්වා. ඒක නිරාකරණය කරලා දෙන්න කියලා කිව්වා.

ගිය සභාවෙදි ඉ - 2 යෝජනාව හැටියට හිග දඩ පොළි අය කරන්න භූගත කඩ කාමර 05 ක් ඉදිරිපත් කරලා තිබුනා. මම පලමුවෙන්ම කථා කරලා , ඒකට විරුද්ධ වුනා. මට නගරයේ වෙළඳ සංගමයෙන් කථා කරලා කියනවා, ඇයි දඩ පොළි අය කරන්න තියෙන යෝජනාවට විරුද්ධ වුනේ කියලා. මං ඇහුවා කාගේද දඩ පොළි? ඊට පස්සේ කියනවා , රුවන්වැල්ල නගරයේ මාකට් එකේ සියළු වෙළෙන්දන්ගේ. මම කිව්වා , එහෙම යෝජනාවක් එහෙම ආවේ නෑ. මට සිද්ධ වුනා ඒ යෝජනාව photo copy ගහලා නගරෙට ගෙනත් දෙන්න. මේ යෝජනා පිලිබඳව අපිව කලින් දැනුවත් කරන්න ඕනි. නැත්නම් සභාපතිතුමා ඔබතුමා දැනුවත් කරන්න ඕනි යෝජනාව කාරක සභා අවස්ථාවකට පත් කරලා. අපි මේ යෝජනාව ප්‍රතික්ෂේප කලා. මේකේ වෙලා තියෙන කාරණය ඊයේ subject කරන මිස් පැහැදිලිව සඳහන් කලා. එතුමිය කියන්නේ, හිග කඩ කුලී ගෙවලා අවසන් කරපු අයට මේ දඩ පොළිය අයින් කරන්න ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යවලා , මාකට් එකේ යම් කිසි කොටසකගේ දඩ පොළිය අයින් කරලා තියෙනවා. යම් කිසි කොටසකගේ අයින් කරලා තියෙන නිසා තවත් එවැනිම කොටසක් කඩ කුලී ගෙවලා අවසන් කරපු අයට ආණ්ඩුකාරතුමාට යවන්න තමයි ඉල්ලලා තියෙන්නේ. හැබැයි මාකට් එකේ තව කොටසක් ඉන්නවා , කඩ කුලී ගෙවමින් ඉන්නවා. ඒ අයගෙත් දඩ පොළි අයින් කර ගන්න අවස්ථාව සලසා ගන්න කියලා. ඒ ක්‍රමය තුලින් ප්‍රාදේශිය සභාවේ කුලිය අය වීම වැඩි වෙලා තියෙනවා. සභාවට මුදල් අය වීම් වැඩි වෙලා තියෙනවා. මේක හොඳයි. මෙහෙම මේ යෝජනාව භූගත කඩ කාමර 05 කට කියලා දැම්මාම අපිට ප්‍රශ්නයක් තියෙනවා. ඒ අය වැරදි විදියට හිතනවා. උපාලි මන්ත්‍රීතුමා තමයි මේකට විරුද්ධ වෙලා අයින් කරේ කියලා කියනවා. මං දන් නෑ කවුද ඒක මේ සභාවෙන් කිව්වේ කියලා. යෝජනාවක් දානවා කියලත් ඒ කට්ටිය දැන ගෙන ඉදලා තියෙනවා. මම මේක photo copy කරලා ගෙනත් දුන්නට පස්සේ කිව්වා, මේක වරද්දලා තමයි තියෙන්නේ. සංශෝධනයක් දාන්න කිව්වා. මේකට සංශෝධනයක් හදිසි යෝජනාවක් විදියට දාන්න බෑ. ඊයේ subject එකේ මිස් එක්ක කථා කරලා කිව්වා, ඊගාව සභාවටවත් පැහැදිලි කරලා දාන්න කියලා. ගෙවපු අය ඉන්නවා මාකට් එක ඇතුලේ හිග නැතුව. දඩ පොලිය තියෙනවා. කොටසකට දුන්නා නම් ඉතුරු අයත් හරියටම ගණන් කරලා දෙසැම්බර් 31 ට අවසන් කරපු අය , ලේඛන 02 ම හදලා ගේන්න. ගැටළුවක් නෑ අපිට. හිග ගෙවනවා නම් ඒ අයටත් සහනයක් දෙන්න එපෑ. මේවගේ යෝජනා දාපුවම අපි අපහසුතාවයට පත් වෙනවා. අපිට අඳුරේ අතපත ගාන්න බෑ. අපි යෝජනාව ප්‍රතික්ෂේප කලා. දැනුවත් කිරීම නැති කමින් තමයි මේක වෙලා තියෙන්නේ. ඒක ඒ අය පිලි ගත්තා. මේ වගේ දේවල් වෙනකොට අපිව දැනුවත් කරන්න කියලා ඉල්ලනවා. පෞද්ගලිකව දැනුවත් කරන්න අවශ්‍ය නෑ. මේ යෝජනා එනවා. මේ යෝජනා මෙන්න මෙහෙමයි තියෙන්නේ කියලා අපි දැන ගන්න ඕනි. මේ එන විදියට වෙන චිත්‍රයක් අපි ඒ අයට දෙන්නේ. විදුලි බල්බ ගැන නවරත්න ගරු මන්ත්‍රීතුමා කථා කලා. මම 2012 මුල භාගයේ මන්ත්‍රීවරයෙක් හැටියට සභාවට ආවා. එදා ඉදන්ම පහුගිය මාසේ දක්වාම අපි හිටියේ කරුවලේ . ඔබතුමාලාගේ හැම තැනම ලයිට් දාලා , ගේ වටේටත් තිබුනා. අපිට තිබුන් නෑ. අපි කිප අවස්ථාවක්ම ඉල්ලුවා. අපිට දුන්නේ නෑ. මම යන ගෙවල් පාරේ ගෙවල් 15 ක් විතර තියෙනවා. එතනට බල්බ් එකක් ඉල්ලුවේ සුදත් මංජුල සභාපතිවරයා ඉන්න කාලේ ඉදන්. ඒක හම්බුනේ නෑ. ඔබතුමාලාට නම් ඒ කාලේ ගොඩක් හම්බ වුනානේ. මම මෙතුමාට කථා කරලා , මට දෙන බල්බ් 05 ත් අරගෙන, අමතර පිච්චිච්ච බල්බ් දාන්න ටිකකුත් අරගෙන වාහනයකුත් අරගෙන ගිහින් වටේම දැම්මා. දැන් හොඳට ලස්සනට වටේම එලිය වැටිලා තියෙනවා. පිච්චිච්ච බලුප් තියෙනකොට අයින් කරලා දාන්න එපෑ. ඉහල මොරාවත්ත පන්සලට මෙහා ටයර් කඩේ ගාව බල්බ් එක පිච්චිලා අවුරුද්දක්. මන්ත්‍රීතුමා දන්නවා ඇති. මන්ත්‍රීතුමාත් ඒ පැත්තේ ගියා. මන්ත්‍රීතුමාට පෙනිලා නැද්ද මන්දා. ඒ නිසා ඒක අයුතු ලෙසින් ලබා ගත්තු දෙයක් නෙමේ. මාකට් එක ගාව කුණු දමන ටැංකියට එහා පස සෙරෙප්පු දමන කඩයක් තියෙනවා. ඒක ඉස්සරහ කාණුවක් තියෙනවා. දැන් වැස්ස පායන නිසා වතුර හිදිලා ඇති. ඒකෙ වතුර පිරෙනවා කියලා ඒ අය කිව්වා. ඇත්ත. වතුර එකේ රැඳිලා තියෙනවා. PHI මහත්තයාට දැනුම් දුන්නා. අර පැත්තට උස වැඩි නිසා , මේ පැත්ත කොන්ක්‍රීට් වලින් පිරෙව්වොත් ඒකේ වතුර රැඳෙන එකක් නෑ. ඒකේ අපවිත්‍රතාවයක් තියෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. ඊගාව වැහි කාලය පටන් ගන්න කලින් ඒකට පියවරක් ගන්න. ඒ කාණුව ලෙවල් වෙලා එන්න කොන්ක්‍රීට් දැම්මා නම් හරි. මේ කාල වකවානුව කොයි වෙලේ අවසන් වෙයිද කියලා අපි දන්නේ නෑ. අපිත් බලාපොරොත්තු වෙනවා අවසන් වෙලා ඡන්දයකට යන්න. මටත් මේ දේශපාලන ක්‍රමවේදයත් එක්කලා මිනිස්සු අතරට යන්න පොඩි ලැජ්ජාවක් තියෙනවා. අපි කරපු වරදක් හින්දා නෙමෙයි. අපේ ජ.වි.පෙ ගරු මන්ත්‍රීතුමා හිටියා නම් හොඳයි. අපි එතුමන්ලාට කිව්වා, එතුමාලා කියන සුන්දර ලෝකය මවන්න පුළුවන්. හොරු , හොරු කියලා හැමෝටම කියන්නේ නැතිව , අනිත් අයත් එකතු කර ගන්න කියලා. තනියෙන් මේ ගමන යන්න බෑ කියලා. එතුමාලා තනියෙන් යන්න හදන්නේ. එතුමාලාට තනියෙන් යන්න බෑ මේ කපේට. බොහෝ අය එකතු කර ගන්නවා කිව්වා. නමුත්, එකතු කර ගත් නෑ. මාලිමාවක් හදා ගත්තට වැඩක් නෑ. ඉන්නේ පරණ සෙට් එකමනේ. අපි කියන්නේ , මාලිමාවට අපිත් එකතු කර ගන්න වැඩ පිලිවෙළක් හදන්න කියලා. ඉහලටත් කිව්වා. එහෙම කරේ නෑ. ඒ නිසා රටේ තියෙන මතයත් එක්කලා අපිට දේශපාලනය කරන්න ලැජ්ජාවකුත් තියෙනවා. ආයතනය තුලත් අපිට ඉස්සර තිබ්බ අභිමානය නෑ. අපේ මව් පක්ෂය එ.ජා.ප.ය . අභිමානවත් පක්ෂය. අලියා ලකුණ. අපිට හරි දුකයි. ඒවා එකට ඒකාබද්ධ වෙලා අද යනවා. තාමත් අපට

කියන්නේ යූ.එන්.පී කාරයෝ කියලා. අපි ස.ජ.බෙ කියලා කවුරුවත් කියන්නේ නෑ. අපි අද කණ්ඩායමට පත් වෙලා ඉන්නේ. මේ දෙගොල්ලන්ට එකතු වෙලා හොඳට යන්න පුළුවන්. ප්‍රශ්නයක් නෑ. දේශපාලනයේ අපි හිටපු නිසා, ඉන්න නිසා මේ ගමන යන්න වෙලා තියෙනවා. දරුවෙක්වත් දේශපාලනයට යොමු කරන්න බලාපොරොත්තු වෙන් නෑ. ගරු මංජුල නවරත්න මන්ත්‍රීතුමා අපේ සුභ සාධක සංගමයේ මුදල පිළිබඳ කරපු යෝජනාවට මම ඒකමතිකව ස්ථිර කරනවා. සභාව විසුරුවපු ගමන් අපි ඒක කරමු. පහුගිය කාල වකවානුව තුල අපි අතරේ යම් යම් මත භේද, ගැටුම් ඇති වුනා. ඒවා කාගෙවත් හිත් තුල නෑ. ඔබ සියළු දෙනාට සුභ නව වසරක් ප්‍රාර්ථනා කරමින් , ඉදිරියේදි අපි ඔබ සියළු දෙනා නැවත වතාවක් එකතු වෙලා , අවුල් වියවුල් නැතුව හොඳ සභාවක් තුලින් යමක් කරන්න ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නවතිනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.සී පුෂ්ප කාන්ති මහත්මිය</u>

සියළු දෙනාට සුභම සුභ අළුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා. අපි එන්නේ අපේ කොට්ඨාශය තුල ඉන්න ජනතාවට පුළුවන් තරම් සේවයක් කරන්න. ජනතාවගේ අදහස් අපිට තමා ප්‍රකාශ කරන්නේ. අපි මෙතනට ඇවිල්ලා කථා කරනවද නැද්ද කියන්න ජනතාව දැනුවත් නෑ. කාන්තාවන් විදියට අපේ අභිමානය අපි රැක ගන්නත් ඕනි. ඡන්දයක් තිබ්බා හෝ නොතිබ්බා හෝ විසුරුවනවා කියලා හැමදාම කියනවා. නමුත් මම නම් එහෙම අදහසකින් සභාවට ආවේ නෑ. සභා වාර්තාව ගෙනත් දෙනකොට අපි ඒ මාසේ සභාවට එන්න ලෑස්ති වෙලා ඉන්නේ. අවසානය දක්වා කොට්ඨාශය තුල තියෙන ගැටළු විසඳා ගන්න තමයි මම නම් බලන්නේ. අපිට සභාපතිවරු 04 ක් හිටියා. ඒ සභාපතිවරු යටතේ කොට්ඨාශයේ මොනවා හරි ගැටළුවක් තිබ්බා නම් මම කරලා දීලා තියෙනවා. මේ සභාපතිතුමත් කරලා දීලා තියෙනවා. මංජුල සභාපතිතුමා ඉන්නකොට ර.50,000.00 අපි උපරිම ප්‍රයෝජනය අපි ගත්තා. මං ඒකෙන් බෝක්කුවක් දා ගත්තා. හෙට අනිද්දා දෙන ලක්ෂය මට ඉක්මනට ලබාදෙන්න. ජනතාව දැන ගන්න ඕනි , අපිට ලක්ෂයක් දීලා තියෙනවා. නැත්නම් හිතනවා ඒ ලක්ෂයෙන් අපි වැඩක් කරලා නෑ. ඒ මන්ත්‍රීවරිය කථා කරලා නෑ. ඒ කොට්ඨාශයට දෙන මුදල අපි වැය කරලා නෑ කියලා හිතනවා. විසුරුවාම අපිට කොට්ඨාශයේ මිනිස්සු වෙනුවෙන් ඒක කරන්න බැරුව යනවා. ඒ නිසා අපි මොනවා හරි ඉල්ලීමක් කරනකොට , ඒක ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. කාන්තාවෝ හින්දාද මං දන් නෑ , ලයිට් වලට අපි ඉල්ලීම් කරේ මුලදිම. මන්ත්‍රීවරියන් 03 ම අහවල් තැන් වලට කියලා ඉල්ලීම් කරලා ලියලා දුන්නා. නමුත්,අපිට අන්තිම මොහොතේ හතර පස් වතාවක් කථා කරලා , මේ මන්ත්‍රීවරයත් දැනුවත් කලා. මෙතුමා හැමදාම කියනවා, අපි ඉන්නේ ඔබතුමාට පක්ෂව දුන්නා, දුන්නා කියන අදහසේ. කෑම බීම කෑවා. පාටි දැම්මා. ඒවා අපේ නෑ. තුන්දෙනාම අපේ කාන්තා අභිමානය රැකගෙන මේ වෙනකල් මේ සභාව තුල වැඩ කලා. අපි එ.ජා.ප 09 දෙනාගේ මතය අනුගමනය කරා. ඒ නිසා සභාපතිතුමනි අපි මොනවා හරි ඉල්ලනවා නම් ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. මට දැනුන විදියට , සභාපතිතුමා මම කියන්නේ මොකක්ද කියලාවත් අහන්නේ නෑ. එහෙම ගතියක් තිබුනා. අහන් නැද්ද? ඇහුනකන් දෙන්න වෙලාවක් නැද්ද ? අපේ කථාව ඔබතුමා අහන්න ඕනි. ප්‍රාදේශීය සභාවට අයත් වැසිකිලියේ ගහක් ඉවත් කරන්න කියලා මම කීප වතාවක් කිව්වා. ඒක මාස ගාණක් තියෙනවා. ගහ වැටිලා. ජනතාවට ඒක පාවිච්චි කරන්න බැරි වෙලා තියෙනවා. මිනිස්සු අපිට බනිනවා. ඇයි ඕගොල්ලන් කියන්නේ නැද්ද මේ ගැන කියලා. එදා මෙතුමා ගෙන්නලා පත්තරේට දමන්න ලෑස්ති වුනා. මම ඒක නතර කර ගත්තා. මාත් ගලපිටමඩ නගරයේ ජීවත් වෙන කෙනෙක් හින්දා මට ලැජ්ජයි. මම සභාවට කථා කරලා නෑ කියලානේ කථාව යන්නේ. ඔබතුමා දෙවනුව අල්ලා ගන්නේ ජනතාව. සභාපතිතුමාට අපි කන් අදිනවාද කියලා අහනවා. ඒ කට්ටියගේ තියෙන වැරදි වහ ගන්න හදනවාද කියලා අහනවා. වැසිකිලිය විශාල මුදලක් යට කරලා හදපු එකක්. නමුත්, ඒකේ කිසි එල ප්‍රයෝජනයක් සභාව අරගෙන නෑ. අවුරුද්දක් ගානේ ටෙන්ඩර් දාලා තිබුනා. කම්ටුවෙන් ටෙන්ඩරේ ඉවත් කරාද නැද්ද මම දන්නේ නෑ. ටෙන්ඩර් එක දාලා තිබුනේ නෑ. ඒ ගැන දැන ගන්න කැමතියි. වැසිකිලිය එක්ක නගරය පිරිසිදු කරන්න කැමැත්තෙන් ඉදිරිපත් වෙන්න මනුස්සයෙක් ඊයේ පෙරේදා ඇවිත් තියෙනවා. ඒකට කුලියක් එයා ඉල්ලනවා. මීට කලිනුත් කෙනෙක් මම ගෙනාවා. ඒකට හිටපු සභාපතිතුමා කැමැත්ත දුන්නේ නෑ. ඒ පුද්ගලයා සභාපතිතුමා මුණ ගැහෙන්න ආවා කියනවා. කොහොමද දන්නේ නෑ. ඒ ගැන දැනුවත් නෑ. ප්‍රධාන නගරයක් හින්දා මිනිස්සු හැමදාම කුණූ වලට බනිනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා කියනවා. ලක්ෂයේ දීමනාව අපිට ඉක්මනින් ලබා දෙන්න. ගලපිටමඩ නගරයේ බස් එකක්වත් නතර කරන්න බෑ. පාරේ වලවල් තියෙනවා. ඒ වලවල් වල වතුර පිරිලා. තාර නැත්නම් කොන්ක්‍රීට් හරි දාලා ඒ වලවල් ටික වහන්න ලක්ෂයේ දීමනාව ලබා දෙන්න. දුනුමාල ගලපිටමඩ බස් එක නෑ. ත්‍රීවිල් වලට විශාල මුදලක් වැය කරන්න වෙලා තියෙනවා. පාසල් දරුවෝ එහා මෙහා යනවා. කලින් තිබුනු උඩුවක - අල්ගම බස් එක පාර හදන නිසා නතර කරලා තියෙනවා. ඒ බස් එක නැවතත් ලබා දෙන්න කියලා කෑගල්ලේ සම්බන්ධීකරණයට සභාපතිතුමා යනවා නම් ඒකෙදි ඉල්ලන්න කියලා දැනුවත් කරනවා. ගස් ඉවත් කිරීම් වලට ඉල්ලීම් කරපු කට්ටියක් ඉන්නවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. සියළු දෙනාට ස්තුතියි.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

සභාපතිතුමා , මන්ත්‍රීතුමිය කිව් කාරණාව ගැන RDA එකත් එක්ක කථා කලා. මේ දවස් වල ප්‍රිමික්ස් නෑ. මේ මාසේ අවසානයේ වගේ ගන්න පුළුවන්.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලක්ෂයේ යෝජනාවේ වැඩ කරපු අවස්ථා තියෙනවා. වැඩ නොකරපු අවස්ථා තියෙනවා. නමුත්, මම ඒක ණයගිම් දාන්න පුළුවන්ද කියලා උත්සාහ කරලා බැලුවා. පරිපාලනමය ගැටළුවක් ඇති වුනා. මේ අවස්ථාවේ කාරක සභා අවස්ථාවක් අර ගමු. ලේකම්තුමා ඒ ගැන පැහැදිලි කරාවි.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඩී.එන් සුරංගනී මහත්මිය යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා ස්ථිර කරන ලදින් ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ කරුණාරත්න මහතා

ගරු සභාපතිතුමනි, සුදත් මංජුල මැතිතුමාගෙන් පස්සේ අපිට දැනුනේ ඒ සභාපතිතුමා එපා. මේ සභාපතිතුමා ඕනේ කියන එක .මේ මාස කීපයක ඉදන් මැතිවරණය කල් දාමු , මැතිවරණය තියා ගමු. මේවා විතරයි ඇහුනේ. ඊට කලින් තෙල් ටික නෑ කියලා. මෙතුමාම කිව්වා,මොනවා නැතත් අපි සියළු දෙනාම පොහොට්ටුව එකතු වෙලා යනවා කියලා. මෙතුමා එහෙම කිව්වත් මම නම් දැක්කේ , අපේ ජනාධිපතිවරයෙක් පත් කර ගන්නා අවස්ථාවේ මෙතුමලාගේ ඔය කියන නායකතුමා කථා කරලා ඩලස්, ඩලස් කියලා ඩලස්ගේ පිටේ නැගලා ඩලස් පස්සේ ගියා. නමුත්, අපට හැකියාව තිබුනා අර කට්ටියත් ඒකාරාශී කරගෙන එ.ජා.ප ජනාධිපතිවරයෙක් පත් කර ගන්න. එහෙම නොවුනා නම් අපට තවත් ඩලස් කියමින් ඉන්න තිබුනා. අපි දන්නවා මේ දවස් වල ගමේ ස.ජ.බෙ හා ජේ.වී.පී එකට වාසි තියෙනවා. පොහොට්ටුවේ කට්ටියට කථා කරන්න බෑ ආපු ප්‍රශ්නත් එක්ක. මැතිවරණයකදී ඡන්දය දීමේදී ගැටළුවක් තියෙනවා, මැකලම් ආණ්ඩුකාරයා කිව්වා වගේ. 69 ලක්ෂයක් ඡන්දේ දීලා ජනාධිපතිවරයෙක් පත් කර ගත්තා. අවුරුදු 2 ½ ක් යනකොට ලක්ෂ දෙක හමාරක්වත් ගන්න බැරි වුනු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දෙනවා. ස.ජ.බෙ ට දුන්නාම එතුමා ආසයි හයයි. අනුර කුමාර සහෝදරයා අකමැති වෙනකොට ලක්ෂ දෙක හමාරක් ගත්ත නායකයා කැමති වුනා. 69 ලක්ෂයක් ජනතා මතය සෝධාභය රාජපක්ෂට දුන්නා. නමුත්, එතුමාට ඒක පාලනය කර ගන්න බෑ. පාලනය කර ගන්න පුළුවන් කාටද ලක්ෂ දෙක හමාරක් ගත්ත රනිල් වික්‍රමසිංහ මැතිතුමාට. ඔබතුමා මෙතනට පත් වුනා. බලන්න සංයුතිය. පොහොට්ටුවට දෙන්න එපා කියලා ස.ජ.බෙ ට කිව්වා. ඒත් ඔක්කොම දුන්නා පොහොට්ටුවට. මෙතනම එකතු වීම තියෙනවා. මේක හොඳයිනේ. ආර්ථිකය අවුරුද්දක් දෙකක් යනකන් ඔබතුමා ඔතන ඉන්නකෝ. ඔබතුමා කරගෙන යනවානේ. මේ ජනතාවගේ මුදල්. අපේ නායකතුමා කියනවා ප්‍රාදේශීය සභාවක් කරනවා නම් , සභාපති මණ්ඩලයක් ගේන්න ඕනි. අපි දිනපු මන්ත්‍රීවරයෙක් හැටියට අපි මෙතන වාඩි වුනාට, මහජන නියෝජනයක් අපිට දුන්නා. නියෝජනයට ඇවිල්ලා ගමට බල්බ් එකක් දා ගන්න පුළුවන්ද? බෑ. එහෙ නම් මේකේ ක්‍රමයත් වෙනස් වෙන්න ඕනි. පොහොට්ටුව පැත්තෙන් ගත්තත්, එතන වාමාංශික පක්ෂ සියළු දෙනා එකතු වෙලා තමයි වැඩ පිළිවෙලක් හදලා තියෙන්නේ. නායකත්ව මණ්ඩලයට පත් කර ගැනීමේදිත් ගැටළුවක් තියෙනවා. ඉදිරියට යනකල් මෙහෙමම ඉදිරියට ගිහිල්ලා , ජනාධිපතිවරණයක් තියා ගන්න පුළුවන් වෙනකල් මේක යන්න අපිත් උදවු කරන්න ඕනි. මේ විකෘතියක් ගෙනල්ලා දැම්මාට කාටවත් සභාවක් ගෙනියන්න බෑ. අපි සියළු දෙනාම ඒකරාශී වෙලා තව අවුරුද්දක් යමු. ඊගාව ජනාධිපති පත් වෙයි අනුර කුමාර. සිහින කුමාරයා. එතුමා පත් වුනාට පස්සේ ඒ අය ආණ්ඩුවක් පිහිටුවා ගනී. පලාත් සභාවත් පිහිටුවා ගනී. ප්‍රාදේශීය සභාවත් අපි දෙමු. මේක කරන්න පුළුවන් කීප දෙනාටයි. මෙතුමිය කථා කලා. මම හරි සතුටු වුනා. කාන්තාවෝ ගෙනාවේ අපේ නායකතුමා. එතුමිය දක්ෂයි. ඒ ප්‍රදේශය ගැන කථා කලා. එහෙම කථා කරන්න හැකියාවක්, ජවයක් තිබුනා. අපේ නායකතුමා බැලුවේ ඒවා. අපි අදහස් ගෙනාවම ක්‍රියාත්මක කරන්නේ ඔබතුමානේ. ඔබතුමාගේ වැරැද්දක් නෙමේ. ක්‍රමවේදයේ වැරැද්ද තියෙන්නේ. ඒ නිසා අපි ඉදිරියේදි හොඳ වැඩ පිළිවෙලක් ගේමු. මැතිවරණ ගැන කිය කිය ඉන්න නෙමේ, සභාවේ කර ගන්න පුළුවන් දෙයක් අපි කර ගමු. මගේ ලක්ෂය ලැබුනෙත් නෑ. මගේ ලක්ෂයයි, මෙතුමාගේ ලක්ෂයයි එකතු කරලා හත්මත්ත වත්තට යෙදෙව්වා. අද වනතුරු එය ක්‍රියාත්මක වුනේ නෑ. ඒකත් ක්‍රියාත්මක කරලා දෙන්න. අපි සියළු දෙනා ඒකරාශී වෙලා කරන්න පුළුවන් වැඩක් කරමු. හොඳ සැලැස්මක් ඇති වැඩ පිළිවෙලකට යමු කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. සියළු දෙනාට ජය වේවා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ටී.එම් හිතාම් මහතා

සියළු දෙනාට සුභ උදෑසනක් වේවා. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව අවුරුදු ගාණක් යම් කිසි ප්‍රශ්නයක් උඩ දිව්වා. අවුරුදු ගාණක් හිටියත් මට ජේ.සී.බී එක හම්බ වුනේ නෑ. මෙතුමා ආවාට පස්සේ ඒක හම්බ වුනා. රනිල් වික්‍රමසිංහ මහත්තයා ජනාධිපති කරන්න උදවු කලේ පොහොට්ටුවේ උදවිය. එ.ජා.ප අපිට රුවන්වැල්ල ප්‍රාදේශීය සභා අයවැයට සහයෝගය දෙන්න කියලා අපේ පක්ෂ මූලාස්ථානයෙනුත් දැන් වූවා. ගිය සැරේ අයවැයේදි අපේ පක්ෂ මූලාස්ථානයෙන් කිව්වා, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා අයවැයට විරුද්ධ වෙන්න කියලා. අපි පක්ෂය කියන දේත් අහන්න ඕනි. අපේ සහෝදර මන්ත්‍රිවරු කියන දේත් අහන්න ඕනි. මේ ප්‍රාදේශීය සභා ක්‍රමය තිත්ත වෙලා තියෙන්නේ. තමන්ගේ ආසනේ සංවිධායකවරයාට කේලම් කියනවද , ඒ කේලම් කියන උදවිය පැරදුනත් එතුමාව පත් කරනවා. මගේ එ.ජා.ප සංවිධායකවරයා එක්ක හොඳට ඉදගෙන , එතුමාට තවත් මන්ත්‍රිවරු ගැන කේලම් කිව්වා නම් , මම පැරදුනත් මාව පත් කරනවා එතුමා. ජනතා වැඩි ඡන්දයෙන් එන කෙනා පත් වෙන්නේ නෑ. ඔස්මන් රූපසිංහ මහත්තයා 1991 ඉදන් හිටියා. එතුමා පත් වෙන්න ඕනිනේ . එතුමා පත් වුනේ නෑ. ශ්‍රී.ල.නි.ප යෙන් මයිකල් විජේවීර මැතිතුමා සභාපති , උප සභාපති වෙලා හිටියා. එතුමා පත් වෙන්න ඕනි ජොෂ්ඨයා හැටියට. එතුමා පත් වුනේ නෑ. ආසන සංවිධායකට ලං වෙන්නේ කවුද ඒ ගොල්ලෝ පත් වෙනවා. දැනටම මට ආරංචියි. අනේ මගේ කොට්ඨාශයේ මම පරදින්න ඕනි කියලා හිතාගෙන වැඩ කරන මන්ත්‍රිවරු ඉන්නවා. සංවිධායකවරයා එයාව පත් කරනවා. ලැයිස්තුවෙන් එන්න පුළුවන්. මේ ගැන කලකිරිලා ඉන්නේ. අපේ සහෝදර ආනන්ද පෙරේරා මන්ත්‍රිතුමා කිව්වා, මේ සැරේ ඡන්දේ ඉල්ලන්නේ නෑ කියලා. ඒ වගේ කීප දෙනෙක් මට කියනවා. ඡන්දේ ඉල්ලන්න පුළුවන්. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව දැන් හරක් ගාලක් කිව්වා. මේ ප්‍රාදේශීය සභාවට ඉල්ලන එකේ තේරුමක් නෑ කිව්වා. සභාවේ ගරුත්වය රැක ගන්න මන්ත්‍රිවරු දන්නේ නෑ. ජනතාව මෙතනට අපිව පත් කරලා එවන්නේ ජනතාවට සේවය කරන්න. මාත් කලකිරිලා ඉන්නේ ඉල්ලනවද නැද්ද කියලා. ඊට වඩා හොඳයි ගෙදරට වෙලා අපේ ගරුත්වය රැකගෙන ඉන්න එක. ගරු සභාපතිතුමනි, ඔබතුමාව අපි පත් කරේ, ඔබතුමා අපිට ජේ.සී.බී එක , ලයිට් දුන්න නිසා නෙමේ. ජේ.සී.බී, ලයිට් මට ඡන්දේ ඉල්ලන්න ඕනි නෑ. මම ඒ ගැන හිතලා නෙමේ ඔබතුමාට ඡන්දේ දුන්නේ. ඔබතුමා ඒ ගැන හිතන්නත් එපා. මම ඒ වගේ මනුස්සයෙක් නෙමේ. අපිටත් ප්‍රතිපත්තියක් තියෙනවා නේ. නමුත්, පාර්ලිමේන්තු මන්ත්‍රි කෙනෙක් පක්ෂය මාරු කරොත් , ඒ මන්ත්‍රිවරයාට විනය පරීක්ෂණයක් නෑ. සාමාජිකත්වය නැති කරන්නෙත් නෑ. ප්‍රාදේශීය සභා වල ඉන්න අය පක්ෂේ මාරු කලොත් විනය පරීක්ෂණ. මන්ත්‍රිකම නැති කරනවා. මන්ත්‍රිකම නැති කරන නිසා මන්ත්‍රිවරු තවත් පක්ෂ වලට ඡන්දේ දෙන එක නතර කරගෙන ඉන්නවා. අපේ සිරිපාල රත්නායක අපේ ජොෂ්ඨ මන්ත්‍රිතුමා අපේ කණ්ඩායම කැඳවන්න, යම් කිසි පණිවිඩයක් දෙන්න ඒ සියල්ල තිබුනේ එතුමාට. කවුරු කිවුවාද දන්නේ නෑ , එතුමා ස.ජ.බෙ ට සම්බන්ධයි කියලා. එතුමාගේ තනතුර නැති කලා. මගේ විපක්ෂ නායකකම මේකට ගහන්නත් කට්ටිය බලා ගෙන හිටියා. මට දැන් නම් නැත්තට නැති වුනත් කමක් නෑ. දැන් වැඩක් නැනේ. දැන් භය නැතුව කථා කරන්නත් පුළුවන්නේ. මේ සභාවේ දැන් කාලය ඉවරයිනේ. මේ ක්‍රමය හරි නෑ. මනාප ක්‍රමය එන්න ඕනි. එතකොට තමයි මන්ත්‍රිවරුන්ට තියෙන ගෞරවය රැකෙන්නේ. ඡන්ද 100 ගත්ත කෙනත් මේ සභාවේ ඉන්නවා. ඡන්ද 60 ක් ගත්තු කෙනත් මේ සභාවේ ඉන්නවා. ඊට වැඩිය ගත්තු කට්ටිය ඉන්නේ ගෙවල් වල. ඒකයි මේ ක්‍රමය. මම වැඩි දුර කථා කරන් නෑ. මට මේ දේවල් පැහැදිලි කරන්න අන්තිම මොහොතේ හරි අවස්ථාව ලැබීම ගැන ස්තූතිවන්ත වෙනවා. ඔබ තමුන්නාන්සේලා සියළු දෙනා නැවත වතාවක් ඡන්දය ඉල්ලනවා නම් මේ සභාවට තේරෙන්න ඕනි යැයි හදවතින්ම ප්‍රාර්ථනා කරනවා. මංජුල නවරත්න මන්ත්‍රිතුමා ගෙනාපු , මිය ගිය සහෝදරයාගේ දරු පවුලට ඒ මුදල ලබා දෙන්න ඕනි කියන එකට මමත් එකඟ වෙනවා. ඇත්තටම අසරණ පවුලක්. ඒ මරණය ආරංචි වෙලා මමයි , සිරිපාල මන්ත්‍රිතුමයි සභාවට ආවා. අපි එවලෙම සභාපතිතුමත් එක්ක ඒ නිවසට ගියා. අපේ සේවකයෝ අවශ්‍ය දේවල් සියල්ලම සකසමින් සිටියා. නමුත්,අවාසනාවට අවසන් කටයුතු වෙලාවේ එතනට සහභාගි වෙන්න බැරි වුනා. මගේ ඥාතිවරයෙක් නැති වුන නිසා මට එහෙ යන්න වුනා. ඒකටත් මම කණගාටුව ප්‍රකාශ කරමින් සියළු දෙනාට ලැබුවා වූ අළුත් අවුරුද්ද සුභම සුභ අළුත් අවුරුද්දක් වේවායි පතමින් මම නිහඩ වෙනවා.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි ඩී.ඒ.කී.කේ කරුණාරත්න මහතා</u>

මම දේශපාලනය කලා කියලා මම මේ කට්ටිය තරහා කරගෙන මට ඇති වැඩක් නෑ. මම දන්නවා කවදා හරි මේ කට්ටිය මට එකතු කර ගන්න ඕනි කියලා. මෙතුමගේ සංවිධායක ධූරය ගැන කථා කලා. මට බලයක් තියෙන, මට පරිපාලනය කර ගන්න පුළුවන් අවස්ථාවක වුනු දෙයක් නෙමෙයි. එතුමලා පක්ෂයත් එක්ක ඉන් නෑ. එතුමාලා දෙපැත්ත අඩිය තියාගෙන ඉන්නේ. නැත්නම් පක්ෂෙත් එක්ක ඡන්දේ ඉල්ලනවානේ. මම ඒ දෙකටම සම්බන්ධයක් නෑ. මෙතුමට මම අන්තිම වෙලාවෙත් කථා කලා. වැරදි අවබෝධක් ගන්න එපා. එහෙම කිව්වාම ඇස් ටික මා දිහාට යොමු වුනා. මම දිලා තමයි ෂොට් එක කියලා.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි ඒ.ඒ.සී.ඒ අධිකාරි මහතා</u>

ගරු සභාපතිතුමනි, අපේ සභාවේ සේවය කල සුනිල් වික්‍රම සහෝදරයාට ශෝකය පල කරනවා. 2023 නව වසර සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ප්‍රාදේශීය සභා පැමිණෙන්න කලින් ගම් සභා තිබුනා. පී.සී ඉඹුලාන මැතිතුමාත් ගම් සභාවෙන් ඇවිල්ලා තමයි ඇමතිකම් ගත්තේ. අතාවුද සෙනෙවිරත්න මැතිතුමත් එක් දහස් නවසිය පනස් ගණන් වල ගම් සභාවෙන් තමයි ආවේ. ගම් වල වැඩ ජනතාව එකතු කරගෙන ශ්‍රමදානයෙන් කලා. ඒ කාලේ ගම් සභා නියෝජිතයාට වැටුපක් දුන්නෙත් නෑ. ගමේ තිබුනු එකමුතුකම , අපේකම බොහොම නියෝජනය වුනා. ප්‍රාදේශීය සභා ඡන්දේ තුල ඒක දුරස් වෙලා , ගමේ පලවෙනි වතාවට එන මන්ත්‍රීතුමා මොනවා හරි කරලා දුන් නැත්නම් එයාව ඊළඟ වතාවේ අයින් කරලා වෙන කෙනෙක් එනවා ප්‍රාදේශීය සභාවේ මනාප ක්‍රමය තුල. මනාප ක්‍රමය අයින් කරලා නැවත මේ වසම් ටිකක් එකතු කරලා කොට්ඨාශ ක්‍රමයක් ගෙනාවා. ඒ ක්‍රමය තුල පොහොට්ටුවෙන් 15 ක් දිනුවා. එක්සත් ජාතික පක්ෂයෙන් එක් කොට්ඨාශයක් දිනුවා. ඊළඟට පත් කරපු මන්ත්‍රිවරු පත් වුනා. ඒ අය පත් වුනේ ශ්‍රී.ල.නි.ප ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සංධානයෙන් පත් වුනා. එවලේ ශ්‍රී.ල.නි.ප වැඩිම ප්‍රතිශතය තිබුනේ මට. ඒ නිසා මාව පත් කලා. අපේ කම්කරු කොංග්‍රසයෙත් ,අපිත් එක්ක හිටපු පක්ෂයක් හැටියට අපේ මන්ත්‍රීතුමා පත් කලා. මුස්ලිම් ජනතාව නියෝජනය කරන්න ඕනි නිසා ෆාතිමා මන්ත්‍රීතුමිය පත් කලා. තව කාන්තාවක් පත් කරන්න ඕනි හින්දා නිලූකා මන්ත්‍රීතුමිය පත් කලා. එහෙම පත් කලේ , අතාවුද සෙනෙවිරත්න මැතිතුමා කිව්වා, දෙමළ , මුස්ලිම් ඔක්කොම එක ගොඩකට ගේන්න ඕනි කියලා. මට පොහොට්ටුවෙන් ඡන්දේ ඉල්ලන්න කිව්වා. හිතට එකඟව මට බෑ. මට පක්ෂයක් ඕනි. ඒ නිසා ශ්‍රී.ල.නි.ප තුල ඉන්නේ කියලා ඒකෙන් ඉල්ලුවා. අද මං එනකොට මට tele phone කරලා අහනවා, අපිත් යන්න කැමතියි plane එකේ කියනවා. මම මේක දන්නෙත් නෑ. මම ඇහුවා ඇයි ඒ කියලා? ඒ තරම් ජනතා ඉල්ලුමක් plan එකටත් තියෙනවා. Plane එක නෙමෙයි helicopter එක. Helicopter එකේ යන්නත් කට්ටිය එකතු වෙලා ඉන්නවා. Helicopter එකෙන් ගිහිල්ලා ඊළග ප්‍රාදේශීය සභාවට බහින්න වෙයිද දන්නෙත් නෑ. ගරු සභාපතිතුමනි, ඉස්සර අපි සතුටු වුනා අපේ ගම් සභා නියෝජිතයෝ ඇවිල්ලා ගමේ යමක් කරන්න හැදුවා. මේ අවුරුදු හතර පහ තිස්සේ අපි තෘප්තිමත් වුනාද? එදා ගම් සභා නියෝජිතයා සතුටු වුනා. අපිට අද සතුටු වෙන්න පුළුවන්ද කියලා අපේ හෘද සාක්ෂියට කථා කරලා අහන්න වෙනවා. අපි මේ අවුරුදු හතර පහ තුල අපි ලයිට් එක විතරද දා ගත්තේ? අපේ ලක්ෂය හම්බ වුනාද? පනස් දාහ හම්බ වුනාද? ලක්ෂ තුන හම්බ වුනාද? ගමට රැකියාවක් යමක් කරන්න පුළුවන් වුනාද කියන ගැටළුව තියෙනවා. අද ඒ සතුට නෑ. පසුගිය අවුරුදු කීපය තුල කලේ එක එක සභාපතිවරු පත් කලා විතරයි. මේ නියෝජන ක්‍රමය වැරදියි. 15 ක් හිටපු එකට 30 ක් ගෙනාවා. කාන්තා නියෝජනයත් ඕනි. ඒක කරන්න තිබුනේ මෙච්චර ප්‍රමාණයකින් නෙමෙයි. මේ නිසා වැඩි මුදලක් වැය වෙනවා. ඒ තුල වැඩ කරනවද? අපි වැඩ කෙරුවාද? ගම් වලට ගියාම ජනතාව අතරට යන්න බැරි ප්‍රශ්නය සෑම කෙනෙක්ටම තියෙනවා. ගරු සභාපතිතුමනි, රට ගත්තාම , මහා උද්ධමනයක් රටේ. දේශීය දේවල් වලට තැනක් නෑ. දේශිය දේවල් විකුණා ගන්න බෑ. අද මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. මේ ප්‍රාදේශීය සභා මැතිවරණය තිබ්බත් , නැතත් ඔබතුමා මේ ඉන්න කාලය තුල රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට හොඳ සේවයක් කරන්න ශක්තිය හා ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනකවා. ඒ ගමන්ම සියළුම මන්ත්‍රිවරුන්ට එක හා සමානව වැඩ කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ මේ පාරවල් ජල සම්පාදනයෙන් කපලා තියෙනවා. ඒ අය කියනවා ප්‍රාදේශීය සභාව දැනුවත් කරලා තියෙන්නේ කියලා. ඒ අය කියනවා , ඒ පාරවල් හදන්න තියෙන්නේ RD එකට කියලා. අද වෙනකොට ඒ පාරවල් ටික කැඩිලා විතරයි. පෙලක් ඒවායේ බට දාලා එලලා තියෙනවා. වසම් 15 – 16 ක ඒක තියෙනවා. සභාපතිතුමාව මං දෙතුන් වතාවක් දැනුවත් කලා. RD එක සහ ජල සම්පාදන ව්‍යාපෘතිය එක්ක කථා කරන්න කියලා ඉල්ලනවා. රුවන්වැල්ලේ ඉන්ධන හල සමුපකාරයෙන් තමා පාලනය වෙන්නේ. ඒ ඉන්ධන හලේ සතියටකට දවස් 02 කට වැඩිය තෙල් නෑ. අනිත් ප්‍රදේශ වල ඉන්ධන හල් වලත් තෙල් අර්බුද තියෙනවා. රුවන්වැල්ල ඉන්ධන නැති ප්‍රශ්නය රුවන්වැල්ල ජනතාවට හුඟක් බලපානවා. තෙල් නැති වුනාම මාගම්මන, අඟුරුවැල්ල ඉන්ධන හල් වලට යනවා. මේ නිසා කාලය හා වියදම යනවා. ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. පාසල් දරුවන්ගේ පොත් පත් ටික ගන්නත් ලොකු වියදමක් යනවා. සහනදායි මිලකට දරුවන්ගේ පොත් පත් ටික ලබා ගන්න වැඩ පිලිවෙලක් හැදුවොත් ගොඩාක් වටිනවා. අනාගත අපේ දරුවෝ ටික යහ මඟට ගන්න නම් යම් වැඩ පිලිවෙලක් කරන්න සිද්ධ වෙනවා. ඉස්සර නම් ප්‍රාදේශිය සභා පාරවල් ටික සුද්ධ කරන්න සභාවේ කම්කරුවෝ ටික යෙදෙව්වා. දැන් ඒක කෙරෙනවා අඩු වගේ පේනවා. වැඩ කරන කම්කරුවෝ වෙන වෙන දේවල් වලට යොමු කරලා තියෙනවා. පාරවල් වල දෙපැත්ත කැලේ වැවිලා. ඉස්සර නම් ගම් වල ශ්‍රමදාන මට්ටමින් කරනවා. දැන් වෙලාව නැති නිසා කරන්නේ නැද්ද මන්දා. ඊයේ පෙරේදා මොරාවත්තේ පැත්තේ උපාලි මන්ත්‍රීතුමා හෙම කරනවා දැක්කා. සභාවේ ඉන්න කම්කරුවෝ තුන් හතර දෙනෙක් හරි ප්‍රදේශ වලට යොමු කරන්න කියලා ඉල්ලනවා. මේ ඉන්න මන්ත්‍රිවරුන්ට නැවත මේ සභාවට එන්නට ශක්තිය, ධෛර්ය , වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. පාර්ලිමේන්තුවේ උගත් මන්ත්‍රිවරු එක කොටසක් වෙලා තියෙනවා. ප්‍රගතිශීලි මන්ත්‍රිවරු ටික, ප්‍රගතශීලි පක්ෂ ටික එකතු වෙලා අළුත් තැනකින් එන්න වැඩ පිලිවෙළක් හදනවා. ඒ වැඩ පිලිවෙල සාර්ථක වේවා. ඒ තුලින් රුවන්වැල්ලේ ජනතාවටත් සේවය කරන්න ලැබේවායි පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඩී.එන් සුරංගනී මහත්මිය</u>

සභාපතිතුමනි, අද දවසෙදිත් කථා කල යුතුයි කියලා හිතනවා. ඔබතුමාටත්, ලේකම්තුමා ඇතුළු ගරු කාර්ය මණ්ඩලයටත්, ගරු මන්ත්‍රි මණ්ඩලටත් සුභ අළුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මං ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් දේශපාලනයට පැමිණියා. මේ අවස්ථාවේ අතාවුද මහතාව සිහිපත් කරනවා. අපි මේ මාසේ හෝ ලබන මාසේ සභාවෙන් සමු ගනී. ඒත් අපි යුතුකම් අමතක කල යුතු නැහැ. මේ අවස්ථාව ලබා දීලා දේශපාලන රාමුව තුල සභිකයින් කොහොමද කටයුතු කරන්නේ? අපේ නායකයින් කොහොමද කටයුතු කරන්නේ කියන සියල්ල අපි මෙතනට ඇවිල්ලා තමයි ඉගෙන ගත්තේ. ගමක ඉන්න කෙනෙකුටත් මේ දේවල් කොහොමද කරන්නේ කියන මාර්ගය අවබෝධ කරලා දුන්නට එතුමාටත් , දිවංගත අතාවුද මැතිතුමාටත් මම අවස්ථාවේ ස්තුති කරනවා. අපි හිටපු කාල සීමාව තුල අධිකාරි මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන් අපිට පුංචි වැඩ කොටස් ටිකක් කරන්න විතරයි ලැබුනේ. ආණ්ඩු 02 ක් ඇතුලේ හිටියත් අපිට කිසිම ආණ්ඩුවකින් කිසිම සහයෝගයක් ලැබුනේ නෑ. අපිට ප්‍රධාන අරමුණ වෙලා තිබුනා, ගමක තියෙන පාරක් හදා ගන්න. ඒ වගේ දේවල් වලට මූලිකත්වය දීලා කටයුතු කලා. අපිට ඒ දේවල් කර ගන්න බැරි වුනා. ඒක අපි ලොකු අභාග්‍යයක් විදියට දකිනවා. ඉල්ලීම් කරත් අපට සැලකුවේ නෑ. ඒවා කණගාටු දායකයි. සභාපතිතුමනි, මේවගේ දේවල් කිසි කෙනෙකුට නොවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. බෝධි මන්ත්‍රිතුමා, පුෂ්පා මන්ත්‍රිතුමිය කිව්වා වගේ කාන්තාවෝ පත් කරලා එව්වා කථා කරන්න තමයි. කාන්තාවන්ගේ හඬට කන් දුන්නාද කියන සැකය තියෙනවා. අපි පොඩි දේවල් තමා ඉල්ලලා තියෙන්නේ. ඒ දේවලුත් අපිට ඉෂ්ට කර ගන්න බැරි වෙලා තියෙනවා. ඒක තමයි මේ දේශපාලනයේ ස්වභාවය කියලා මට තේරුම් ගිහිල්ලා තියෙන්නේ. ලංකාවේ තිබුන ගොඩක් අර්බුද මැද ගිය සභාව මේක වෙන්න ඇති. අපි ගොඩක් අසරණ වෙච්චි අවස්ථා තියෙනවා. ඒ තුල කණගාටු වෙච්චි අවස්ථා තියෙනවා. එහෙම දේවල් මැද්දෙන් ආපු ගමනක අවසාන කාල පරිච්ඡේදය තමයි මේ නිමා කරමින් යන්නේ. මේ අවස්ථාවෙදි මා සමඟ හිටපු සහෝදර මන්ත්‍රිතුමන්ලා හැම කෙනාටම තමන්ගේ කොට්ඨාශ වලට නායකත්වය දීලා වැඩ කරන්න ශක්තිය , ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ඔබතුමාටත්, කාර්ය මණ්ඩලයේ සියළුම දෙනාටත් අපේ සභාවේ කටයුතු කරගෙන යන්න ලැබේවා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි පී රාමචන්ද්‍ර මහතා</u>

සභාපතිතුමාගෙන් අවසරයි. උදා වූ නව වසර සියළුම දෙනාට සෞභාග්‍යමත් වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා අපේ අධිකාරි මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටියා , කොන්ග්‍රස් එකෙන් අපිව දෙමළ නියෝජනය කියන මතයෙන් පත් කලා කියලා. එතුමාටත් , සංවිධායකතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මේ පාර නම් අපේ ගරු සංවිධායකතුමාටත් , අපේ අධිකාරි මන්ත්‍රිතුමාටත් ඕක සිදු වෙන්නේ නෑ. මම කොන්ග්‍රස් එකෙන්ම , ඡන්දේ ඉල්ලන්නේ නෑ කියලා ජීවන් ඇමතිතුමාටම ප්‍රකාශ කරලා අවසන්. ඒ වගේම මාගේ සහෝදර මන්ත්‍රිතුමත් අපි දෙපලම මේ පාර කවුරුවත් නොසිතු දේශපාලන ඉදිරි ගමනක් එනවා කියන දේත් මම මේ අවස්ථාවේදි ප්‍රකාශ කරනවා. නමුත්, මේ හිටපු අවුරුදු 05 ක කාල සීමාව තුල , හිටපු සභාපතිවරු සියළුම දෙනා මට නම් සෑහෙන්න උදවු කරලා තියෙනවා. ඒ සියළුම දෙනාට මගේ ස්තුතිය පුද කර සිටින්නට ඕනේ. මම මොනවා කිව්වත්, මට හැම දේම කරලා දීලා තියෙනවා. ඒකට මම හිටපු සභාපතිවරු සියළු දෙනාට ස්තුතිවන්ත වෙනවා. යම් කිසි වචන හුවමාරු වීම් හෝ හිටපු අපේ මන්ත්‍රි මණ්ඩලයට මගෙන් වැරැද්දක් වී නම් සියළු දෙනා සමා වෙන්න. අපේ සිරිපාල මන්ත්‍රිතුමා ප්‍රකාශ කලා, උප සභාපතිතුමා ගැන. ඒ මතය මිසක මේ සභාවේ කිසිම දවසක අපි විරසකව හිටියේ නෑ. යම් කිසි කාල සීමාව තුල පෙලක් අය මා එක්ක කථා කරන් නැතිවත් හිටියා. මේ සභාවේ ජ්‍යෙෂ්ඨයෝ කරපු වැඩ හින්දා අපි ආධුනිකයෝව මුලා කලා. ඒ වගේ දේවල් අපි හිතුවේ නෑ. දේශපාලන දිවියට ඇවිත් අවුරුදු 05 යි. නමුත්, මටත් යම් කිසි සාමාන්‍ය දැනුම ඇතිව මං මේ වෙනකොට වෘත්තීය සමිතියක ඉන්නවා. වතු ක්ෂේත්‍රයට ඇවිත් අවුරුදු 18 ක් වෙනවා. මගේ වෘත්තීය සමිතියේ සාමාජිකයෝ 581 ක් විතර ඉන්නවා. ඒකෙදිත් මෙවැනි ගැටළු ඇති වෙනවා. සතියයි, දෙකයි. ඒක විසඳලා ඒ කට්ටියත් එක්ක අපි යනවා. රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාශය තුල ලංකා වතු කම්කරු කොංග්‍රසයේ වෘත්තීය සමිතියේ ප්‍රධාන සභාපති ධූරය මං දරනවා. මම ජීවන් ඇමතිතුමාට කිව්වා, ඔබතුමා වෙන කෙනෙක් පත් කරන්න. අපේ විජේ කුමාර මන්ත්‍රිතුමාගේ තරඟකාරිත්වයටම අද එක් කෙනෙක් අභියෝග වෙලා තියෙනවා. මම එතුමාට ඊයේ අඩ ගහලා කිව්වා. එතුමා පොහොට්ටුවේ වෘත්තීය සමිතියේ සභාපති. නමුත්, මම ලංකා  වතු කම්කරු කොන්ග්‍රසයේ සභාපති. හිටපු කෙනාට ප්‍රශ්නයක් ඇති වෙනකොට , මගේ මන්ත්‍රි ධූරය මට අහිමි වුනත් මම , මට වෙන පක්ෂයකින් ඉල්ලන්න කියලා, මම දෙනවා අනිවාර්යයෙන්ම. මට ඕන පක්ෂයකින් ඉල්ලන්න පුළුවන්. ෂිහාම් මන්ත්‍රිතුමා කිව්වා ,අපිට ඕනි මනාප ක්‍රමය කියලා. මේ ජාතික ලැයිස්තුව මට නම් එපා. ෂිහාම් මන්ත්‍රිතුමාටයි, මටයි නම් ගැටළුවක් නෑ. භය නැතුව ඡන්දය ඉල්ලනවා. මනාප ක්‍රමය ආවොත් අපිට ඡන්ද කොටසක් තියද? නැද්ද කියන කථාවත් එක්ක කොහොමද හැසිරෙන්නේ? ජනතාව අපිත් එක්ක ඉන්නේ කොහොමද ඉන්නේ කියන මතය අපිට තියෙනවා. ඒක නිසා මෙම ක්‍රමයට මාත් සම්පූර්ණ විරුද්ධයි. මනාප ක්‍රමය ආවොත් අපිට කිසිම ගැටළුවක් නෑ. සුළු ජාතිය නියෝජනය කලා. මෙයා ජාතික ලැයිස්තුවෙන් ආවා. මෙයාට මනාප නෑ. මෙයාට ඡන්ද නෑ. අපි හින්දා මෙයා මෙතනට ආවා. ඒ මතය නැති වෙයිනේ. මට අංකයක් දුන්නොත්, ඒ අංකය යටතේ කීයද මනාප ලැබිලා තියෙන්නේ? අපිටත් ජනතා කොටසක් ඉන්නවා කියන මතය සභාව තුල එයි. අපි ඉන්න වකවානුව තුල සමහර අය හිතයි, සුළු ජාතිය නියෝජනය කරන විදියට නියෝජනයක් දුන්නා. මේ දෙපලට මනාප නැතුව ඇති කියන මතය සමහර විට

තියෙන්න පුළුවන්. ඒ මනාප ක්‍රමය ආවොත් අපිට පෙන්වන්න පුළුවන් අපිටත් යම් කිසි දෙයක් කරන්න පුළුවන් කියන එක. දේශපාලනයේ හැමදාම තරහා වෙලා ඉන්නෙත් නෑ. හතුරුත් නෑ , මිතුරුත් නෑ කියන එක මගේ දේශපාලනය. අපේ තාත්තා 1964 දි ආචාර්ය ඇන්.ඇම් පෙරේරා මහත්තයා දුන්නු කාඩ් එක අපිට දීලා ගියේ. මේ පක්ෂය දාලා යන්න එපා කිව්වා. තාම අපි ඒ වාමාංශික මතයේ ඉන්නේ. අතාවුද සෙනෙවිරත්න මැතිතුමා අද අපි අතර නෑ. එතුමාගේ ප්‍රතිපත්ති අනුව තමා අපි ගමන් කලේ. එතුමත් අපි අතර නැති කොට , ඒ ප්‍රතිපත්ති එක්ක ගමනක් යන්න ඉතාම අමාරු තත්වයක අපි ඉන්නේ. අපේ දෙමාපියෝ ප්‍රකාශ කරපු දේත් වෙනස් කරන්න වෙයිදෝ කියන සැකයකින් අපි මේ ගමන ගමන් කරන්නේ. එම නිසා ඔබ සියළු දෙනාට මම ප්‍රකාශ කර සිටිනවා, මේ අවුරුදු 05 තුල මගේ දුක , සැපේදි හිටපු සියළු දෙනාට මගේ ස්තුතිය සහ පවුලේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

විශේෂයෙන්ම මතක් කරන්න ඕනි කාරණාවක් තමා, 2013 වසරේ සිට සභාවේ කම්කරුවෙක් විදියට කටයුතු කරලා , අපි අතරින් හදිසියේ මිය ගිය එච්.ඒ සුනිල් මහත්මාගේ අවමංගල්‍යා. ඒ ගැන මම දැන ගත් මොහොතේ ඉදලා සභාපතිවරයා විදියට ඒ කටයුතු වලට මට පුළුවන් දායකත්වය දුන්නා. අපේ මොන මොන මති මතාන්තර තිබුනත් ගරු මන්ත්‍රි මණ්ඩලය ඒ කටයුතු කරන්න අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය බොහොම යුහුසුළුව ඒ කටයුතු කරන්නට අවශ්‍ය වාතාවරණය හදලා දුන්නා. ඒ නිවහනට අපි මධ්‍යම රාත්‍රියේ යනකොට පාර දෙපැත්තේ යන්න බැරි මට්ටමට කැලය වැවී තිබුනා. උදේ 9 වන විට ඒ සියල්ල එළි පෙහෙළි කරලා අවශ්‍ය කටයුතු සිද්ධ කලා. තරුණ පිරිසට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ හත් දවසේ බණ 2023.01.13 දින පැවැත්වෙනවා. ඒ අවස්ථාවට සියළු දෙනා සම්බන්ධ වන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විශේෂ දැනුම් දිමක් තියෙනවා, පලාත් පාලන කොමසාරිස්තුමා එවපු ලියුමක් තියෙනවා. ( ප.පා.කො විසින් අංක CLG / AD/ 1/7/ 2022/ 3 දරන හා 2023.01.03 දිනැතිව එවන ලද සභිකවරුන්ගේ මාසික දිමනා ගෙවීම සම්බන්ධ ලිපිය සභාව හමුවේ කියවන ලදි. ) සරත් මන්ත්‍රීතුමා කිව්වා, අපේ ගෝණගල්දෙණිය කඩ ඉදි කිරීම සම්බන්ධව. ඒ අවශ්‍ය කටයුතු හැකි ඉක්මනින් කරන්නට අදහස් කරනවා. රුවන්වැල්ල සතිපොල ටෙන්ඩර් නොවූ මස් කඩ දැන් ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදලා තිබෙනවා. ඉඹුලාන පුස්තකාල භූමියේ ඉවුර සම්බන්ධයෙන් උපාලි මන්ත්‍රීතුමා අවස්ථා ගණනාවකදි සඳහන් කලා. එහි අයිතිකරුත් ඇවිල්ලා කථා කලා. මේක සෑහෙන දවසක් යන වැඩක්. නමුත්, මම හිතනවා මේ කාල සීමාව තුල ඒ කාර්යය කර ගන්න ලැබේවි. මම ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන බව ප්‍රකාශ කරනවා. පී.සී ඉඹුලාන අපේ දිවංගත හිටපු අමාත්‍යතුමා නමින් බෝපැත්ත මාර්ගය නම් කිරීම සම්බන්ධයෙන් දැනට අවශ්‍ය කටයුතු සිදු වෙනවා. ඉක්මනින් සියළු දෙනාව දැනුවත් කරලා, දිනයක් දාගෙන ඒ කටයුත්තට අවශ්‍ය වාතාවරණය සලසලා ඔබව දැනුවත් කරන බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. අඟුරුවැල්ල ළමා උද්‍යානයේ තිබෙන නිවාස ඉවත් කිරීම සම්බන්ධයෙන් , පොලිස් ස්ථානාධිපතිතුමත් අපිත් එක්ක කථා කලා. එතන යම් යම් අක්‍රමිකතා සිදු වීම් වෙනවා කියලා කිව්වා. හැකි ඉක්මනින් ඒ අනවසර නිවස ඉදි කිරීම ඉවත් කිරීමට කටයුතු කරනවා. දඩ පොළි ඉවත් කිරීම සම්බන්ධව පහුගිය සභාවට යෝජනාවක් ගෙන ආවා. විෂය ඒ යෝජනාව පැහැදිලිව ලියලා තිබුනේ නැති නිසා , මන්ත්‍රිවරු ඒ පිළිබඳව අනවබෝධයෙන් කටයුතු කලා. මීළඟ සභාවෙදි මම ඒ යෝජනාව නැවත වරක් ඉදිරිපත් කරනවා. ගලපිටමඩ වැසිකිලියට වැටී ඇති කිතුල් ගහ ඉවත් කිරීම සඳහා මම කාර්මික නිලධාරිනිය යැවුවා. මම ලේකම්තුමාට නියෝග කරනවා හැකි ඉක්මනින් ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉෂ්ට කරන්න කියලා මම ප්‍රකාශ කරනවා. දුනුමාල - ගලපිටමඩ බස් එක ගැන මෙතුමිය කථා කලා. ඒ බස් එක මේ වන විට නැවතිලා තියෙන බව මට කීප දෙනෙක් කථා කරලා කිව්වා. මම අදාල ඩිපෝවට ඒ බව දැනුම් දීලා එය යථා තත්ත්වයට පත් කරන්නට අවශ්‍ය කටයුතු කරනවා. මේ කාල වකවානුව තුල දරුවන්ට පොත් පත් ගැනීමේ අපහසුව පිළිබඳව අපේ අධිකාරි මන්ත්‍රිතුමා කිව්වා. මම ඒ සම්බන්ධව යම් වැඩ පිළිවෙලක් යොදන්නට බලාපොරොත්තු වෙනවා. අපි සභාවට පැමිණිලා වසර 05 ක් ඉක්මවා යන කාල සිමාවක්. අපේ මොන මොන මතිමතාන්තර තිබුනත් සභාවෙන් එළියට යනකොට අපි බොහොම සහෝදරත්වයෙන් කටයුතු කරනවා. මං සභාපතිවරයා ලෙස පත් වෙලා බොහොම කෙටි කාලයකින් මට හැකි දේ කලා කියලා මම හිතනවා. යන්ත්‍ර සූත්‍ර වල අඩුපාඩු තියාගෙන අවශ්‍ය කටයුතු ඉෂ්ට සිද්ධ කර දෙන්නට උපරිම උත්සාහයක් ගත්තා. තව මන්ත්‍රිවරු සහ මන්ත්‍රිවරියන් කීප දෙනෙකුට ජේ.සී.බී යන්ත්‍රය ලබා දෙන්නට තිබෙනවා. ඒත් එක්කම ලයිට් 05 ක් ගරු මන්ත්‍රිවරුන්ට ලබා දුන්නා. ගිය සභාවෙදි ඒ ලයිට් 05 ලබා දෙන්නට ස්ථාන නම් කරලා ලිපි දෙන්න කියලා මං මතක් කලා. මට නොදුන්නත් ලේකම්තුමාට දෙන්න කියලා මම කිව්වා. තව වෙනකන් නුදුන් මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අය අදාල ස්ථාන නම් කරලා දෙන්න කියන ඉල්ලීම කරමින් හා 2023 උදා වූ නව වසර සැමට සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් අද දින මහා සභාවේ කටයුතු අවසන් කරනවා. ස්තුතියි.

මෙදින ගරු මහා සභාවේ කටයුතු ප.ව 12.20 පමණ වන විට අවසන් විය.

**පී.ජී.යූ ජයවික්‍රම,**

**ලේකම්,**

**ප්‍රාදේශීය සභාව,**

**රුවන්වැල්ල.**